# දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

# சுதேச வைத்திய நிறுவகம்

# INSTITUTE OF INDIGENOUS MEDICINE

# කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව

# கொழும்ப் பல்கலைக் கழகம் இலங்கை

# UNIVERSITY OF COLOMBO, SRI LANKA

# වාර්ෂික වාර්තාව

# ஆண்ட றிக்கை

# ANNUAL REPORT

# 2011

# දැක්ම

ආයුර්වේද, යුනානි සහ දේශීය වෛද්‍ය ක්‍රමයන් පිළිබඳ ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම ආයතනය බවට පත්වීම.

# මෙහෙවර

ශ්‍රී ලංකාවේ ආයුර්වේද, යුනානි සහ
දේශීය වෛද්‍ය ක්‍රමයන්හි උන්නතිය
සඳහා අවශ්‍ය දැනුම ව්‍යාප්ත කිරීමට සහ
වර්ධනය කිරීමට අදාල වන අධ්‍යයන සහ
පර්යේෂණ කටයුතු පැවැත්වීම.

# ආයතනයේ සංවිධාන ව්‍යුහය



## අධ්‍යක්ෂවරයාගේ වාර්තාව

2011 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව බලවත් ප්‍රීතියකින් සහ අභිමානවත් හැඟීමකින් යුතුව මම ඔබ වෙත පිළිගන්වමි. කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය 1929 වර්ෂයේදී දේශීය වෛද්‍ය විද්‍යාලය නමින් පිහිටුවන ලදී. එය 1977 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආයුර්වේද, යුනානි සහ පාරම්පරික වෛද්‍ය ක්‍රමවල මානව සම්පත් සංවර්ධනය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරන ලදී. මේ වන විට ආයතනයේ උපාධි අපේක්ෂකයින් 600 පමණ සිටින අතර ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන්හි සිසුන් 64 පමණ අධ්‍යයන කටයුතුවල නිරත වේ.

වර්ෂ 30 කට පසු 2011 වර්ෂයේ දී බෙහෙත් පැළෑටි සහ ඖෂධීය නිෂ්පාදන ආශ්‍රිත තුන්වන අන්තර්ජාතික සම්මන්ත්‍රණය (ICMPHP-2011) සහ මහජනතාව වෙනුවෙන් ආයු මෙඩිකා (Ayu Medica) ප්‍රදර්ශනය පැවැත්වීමට මෙම විද්‍යායතනයට හැකියාව ලැබිණි.

2011 වර්ෂයේ විෂය නිර්දේශ ප්‍රතිසංස්කරණය යටතේ ආයුර්වේද ක්ෂේත්‍රය තුළ වර්තමානයේදී ඉතා ඉහළ ඉල්ලුමක් පවතින නව වෛකල්පිත විෂයයන් සමගින් නව විෂය නිර්දේශයක් වර්ෂ දහ අටකට (18) පසු හඳුන්වා දෙන ලදී. එමගින් කාලීන අවශ්‍යතාවය අනුව ආයුර්වේද සහ යුනානි පාඨමාලා සංවර්ධනය කිරීමටත් අනාගත රැකියා අවස්ථාවන්ට ගැලපෙන ලෙස සිසුන් පුහුණු කිරීමටත් හැකියාව ලැබී තිබේ. ශ්‍රී ලංකාවේ ප්‍රථමවරට ආයුර්වේද ක්ෂේත්‍රය සඳහා MD (ආයුර්වේද) පශ්චාත් උපාධි පාඨමාලාව ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය මෙම වසරේදී සිදු කරනු ලැබීය.

දේශන ශාලා, විද්‍යාගාර, පුස්තකාල වැනි නිසි යටිතල පහසුකම් සහ වඩාත් අවශ්‍ය වන නව ගොඩනැගිලි සඳහා අප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන ආයතනයේ වේගවත් සංවර්ධනය වළකා ඇත. කෙසේ වුවද නවීකරණය සහ යළි නගා සිටුවීමේ කටයුතු මෙම කාලපරිච්ඡේදය අතරතුර කරගෙන යන ලදී. ඒ අනුව දේශනශාලා, පරිගණක මධ්‍යස්ථානය, සම්පත් මධ්‍යස්ථානය සහ ආයතනයේ ප්‍රධාන දොරටුව නවීකරණය කිරීමට හැකි වී තිබේ. එමගින් සිසුන්ගේ සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පහසුකම් වැඩි කර ඇත.

එසේම 2011 වර්ෂයේ ආයතනයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා සහයෝගය දැක්වූ කළමනාකරණ මණ්ඩලයට, අතිරේක අධ්‍යක්ෂක, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, නියෝජ්‍ය මූල්‍යාධිකාරී, අධ්‍යයන, අනධ්‍යයන කාර්ය මණ්ඩලයට සහ ආයතනයේ සියළු දෙනාටම ස්තුති කිරීමට මම මෙම අවස්ථාව උපයෝගී කර ගනිමි. ආයතනයේ කළමනාකරණය වෙත දක්වන ලද සහයෝගිතාවය වෙනුවෙන් උපාධි අපේක්ෂක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශේෂ ස්තුතිය පිරිනමමි.

තවද ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමා ඇතුළු එම අමාත්‍යංශයටත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා ඇතුළු එම කොමිසමටත්, කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිනිය ඇතුළු එම විශ්වවිද්‍යාලයටත් 2011 වර්ෂයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ වැඩ කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම සඳහා දක්වන ලද සහයෝගයට කෘතඥතා පූර්වක ස්තුතිය මෙයින් පිරිනමමි.

වෛද්‍ය ආර්. ඒ. ජයසිංහ
අධ්‍යක්ෂ

## පටුන


| | | | පිටු අංකය |
|---|---|---|---|
| 1. | **විමර්ශනය** | | |
| | 1.1 | කළමනාකරණ මණ්ඩලය | 1 |
| | 1.2 | අධ්‍යයන කමිටු | 3 |
| | 1.2(1) | ආයුර්වේද අංශීය කමිටුව | 3 |
| | 1.2(2) | යුනානි අංශීය කමිටුව | 3 |
| | 1.2(3) | පර්යේෂණ සහ උසස් උපාධි කමිටුව | 4 |
| 2. | **අධ්‍යනාංශ, මධ්‍යස්ථාන සහ ඒකක** | | 4 |
| | 2.1 | ආයුර්වේද අංශය යටතේ ඇති දෙපාර්තමේන්තු | 4 |
| | 2.2 | යුනානි අංශය යටතේ ඇති දෙපාර්තමේන්තු | 5 |
| 3. | **දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය පිළිබඳ සමාලෝචනයක්** | | 5 |
| | 3.1 | උපාධි අපේක්ෂක ශිෂ්‍ය ප්‍රවේශය | 5 |
| | 3.2 | ඩිප්ලෝමා, පශ්චාත් උපාධි වැඩසටහන් | 7 |
| | 3.3 | අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | 8 |
| | 3.4 | පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | 9 |
| | 3.5 | ජාතික සහ ජාත්‍යන්තර තලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය | 10 |
| | 3.6 | පර්යේෂණ, නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර | 13 |
| | 3.7 | වැඩ සටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර | 16 |
| | 3.8 | පුස්තකාලය | 16 |
| | 3.9 | දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ශ්‍රී ලාංකේය වාර ප්‍රකාශනය (SLJIM)-2011 | 17 |
| 4. | **ජාත්‍යන්තර සබඳතා** | | 18 |
| 5. | **මූල්‍යය සහ ගිණුම්** | | 18 |
| | 5.1 මූල්‍ය සමාලෝචන | | 18 |
| | 5.2 අවසන් ගිණුම් - 2011 | | 20-44 |
| | 5.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව | | 45-56 |
| | 5.4 විගණකාධිපති නිරීක්ෂණ වාර්තාව | | 57-70 |

## 01. විමර්ශනය

### 1.1 කළමනාකරණ මණ්ඩලය

ආයතනයේ කළමනාකරණ මණ්ඩලය පත් කොට ඇත්තේ 1929 අංක 7 දරණ දේශීය වෛද්‍ය විද්‍යා ආඥා පනතේ 10 (1) ඡේදයේ ප්‍රතිපාදනයන්ට අනුකූලවය. කළමනාකරණ මණ්ඩලය අධ්‍යක්ෂවරයෙකු (නිල බලයෙන් සභාපති ලෙස) සහ පහත සාමාජිකයන්ගෙන් සමන්විත වේ. එය ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය වේ.

(අ) අධ්‍යක්ෂවරයා

(ආ) උසස් අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ පත් කළ නාමිකයෙකු

(ඇ) සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ ලේකම්වරයා හෝ එම ලේකම්වරයාගේ පත් කළ නාමිකයෙකු

(ඈ) ආයුර්වේද කොමසාරිස්

(ඉ) බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂකවරයා

(ඊ) මධ්‍යම ආයුර්වේද රෝහලේ වෛද්‍ය අධිකාරිවරයා

(උ) කොළඹ විශ්ව විද්‍යාලයීය වෛද්‍ය පීඨයේ පීඨාධිපති

(ඌ) ආයතනයේ එක් එක් අධ්‍යනාංශ ප්‍රධානීන්

එසේම පහත සඳහන් පරිදි සාමාජිකයින්ද කළමනාකරන මණ්ඩලයට තෝරා පත්කර ගැනේ.

(අ) කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය මගින් එහි සාමාජිකයන් අතරින් තෝරා පත් කරගත් සාමාජිකයන් තිදෙනෙක්

(ආ) ආයුර්වේද වෛද්‍ය සභාව මගින් ස්වකීය සාමාජිකයන් අතුරින් පත් කරගත් එක් සාමාජිකයෙකු

(ඇ) සංස්කෘතික, අධ්‍යාපනික, වෘත්තිය හෝ පරිපාලන විෂයයෙහි අප්‍රකට සේවාවක් විදහාපාන ලද පුද්ගලයන් අතුරින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයන් අට දෙනෙකු ඒ අතුරින් එසේ පත් කරගත් සාමාජිකයන් පස් දෙනෙකු පාරම්පරික වෛද්‍ය විද්‍යා වෘත්තියේ සාමාජිකයන් අතුරින් විය යුතුය.

**කළමනාකාර මණ්ඩල සාමාජිකයින්**

අධ්‍යක්ෂ (සභාපති)

වෛද්‍ය ආර්.ඒ. ජයසිංහ මහතා

අංශ ප්‍රධාන/ආයුර්වේද

වෛද්‍ය ඩී.පී.ඒ. දිසානායක මහතා

අංශ ප්‍රධාන/යුනානි

ආචාර්ය බී.එම්. නජීබ් මහතා

අතිරේක ලේකම්/උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

පී.ජී. ජයසිංහ මහතා

අතිරේක ලේකම්/සෞඛ්‍ය අමාත්‍යාංශය

සෝමරත්න විදානපතිරණ මහතා

නියෝජ්‍ය ලේකම්/මහා භාණ්ඩාගාරය

පී.ඒ. අබේසේකර මහතා

ආයුර්වේද කොමසාරිස්

පී.එස්.කේ.ආර්. වීරකෝන් මහතා

අධ්‍යක්ෂ/බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණ ආයතනය

මහාචාර්ය කේ.කේ.ඩී.එස්. රණවීර මහතා

අධ්‍යක්ෂ/ආයුර්වේද ශික්ෂණ රෝහල

වෛද්‍ය ඩී.එච්. තෙන්නකෝන් මහතා

පීඨාධිපති - වෛද්‍ය පීඨය

මහාචාර්ය රොහාන් ඩබ්ලිව්. ජයසේකර මහතා,

වෛද්‍ය පීඨ සාමාජිකයන්

වෛද්‍ය ක්‍රිශාන්ත වීරසිංහ මහතා

වෛද්‍ය පණ්ඩුක කරුණානායක මහතා

**ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජික**

වෛද්‍ය එස්. එම්. එච්. සේනබණ්ඩාර මහතා

**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත් කළ සාමාජිකයන්**

වෛද්‍ය ඒ. පී. නිමල් ජයසිංහ මහතා

වෛද්‍ය සුනිල් අතපත්තු මහතා

වෛද්‍ය  පී. එම්. චන්ද්‍රසිරි මහත්මිය

වෛද්‍ය ඒ. එම්. අබුතහීර් මහතා

වෛද්‍ය උපාලි සෙනෙවිරත්න මහතා

ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර මහතා

ආර්. එච්. එම්. පියසේන මහතා

ලේකම් - නියෝජ්‍ය ලේඛකාධිකාරි/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි

ගාමිණි ජයසූරිය මහතා

අයි. කේ. කේ. විජේකෝන් මහත්මිය 2011.10.01 සිට

**1.2 අධ්‍යයන කමිටු**

**1.2.(1) ආයුර්වේද අංශීය කමිටුව**

දේශීය වෛද්‍ය විද්‍යාවේ අදාල ශාඛාවල අධ්‍යයන පාඨමාලා, පුහුණු කිරීමේ වැඩසටහන් සහ විභාග හා සම්බන්ධ සියළු කටයුතු පිළිබඳ නිර්දේශය ඉදිරිපත් කිරීමේ වගකීම අංශීය කමිටුව වෙත පවරා ඇත.

1979 අංක 7 දරණ දේශීය වෛද්‍ය විද්‍යායතන ආඥා පනතේ 15(1) ඡේදයට අනුකූලව පහත පරිදි 2010 අධ්‍යයන කමිටුව පත් කොට ඇත.

අංශ ප්‍රධාන  (කමිටුවේ සභාපති)

ආචාර්ය ඩී.පී.ඒ. දිසානායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 11 ශ්‍රේණිය

ආචාර්ය ටී.ඩී.එන්. කරුණාරත්න,  ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (2011.02.01 සිට)

සියලුම ස්ථිර කථිකාචාර්යවරුන් අංශීය කමිටුවේ සාමාජිකයන් වේ.

**1.2(2) යුනානි අංශීය කමිටුව**

අංශ ප්‍රධාන (කමිටුවේ සභාපති)

ආචාර්ය එම්.එච්.එම්. නසීම්

ආචාර්ය බී.එම්. නජීබ් (2011.08.05 සිට)

**1.2(3) පර්යේෂණ සහ උසස් උපාධි කමිටුව (RHDC)**

අධ්‍යක්ෂ/සභාපති

අතිරේක අධ්‍යක්ෂ/පශ්චාත් උපාධි අංශය

අංශ ප්‍රධාන/ආයුර්වේද

අංශ ප්‍රධාන/යුනානි

සම්බන්ධීකාරක/යුනානි පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා

සම්බන්ධීකාරක - ආයුර්වේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා

අධ්‍යක්ෂක - ආයුර්වේද ශික්ෂණ රෝහල

නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්

මහාචාර්ය ඩබ්ලිව්.ඩී. රත්නසූරිය - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය - කොළඹ විශ්ව විද්‍යාලය

මහාචාර්ය ස්වර්ණා පියසිරි - පීඨාධිපති (උපාධි අධ්‍යයන පීඨය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)

ආචාර්ය ක්‍රිශාන්ත වීරසිංහ - වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය

නියෝජ්‍ය මූල්‍යාධිකාරි

නියෝජ්‍ය ලේඛකාධිකාරි/ලේකම්

**2. අධ්‍යයනාංශ, මධ්‍යස්ථාන සහ ඒකක**

2.1 ආයුර්වේද අංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

ආයුර්වේද අංශය නම් වශයෙන් දෙපාර්තමේන්තු අටකින් (08) සමන්විත වේ.

I. මෞලික සිද්ධාන්ත (Maulika Siddhantha)
II. ද්‍රව්‍ය ගුණ විඥාන (Dravyaguna Vignana)
III. ස්වස්තවෘත්ත (Swasthavritta)
IV. කාය චිකිත්සා (Kaya Chikitsa)
V. දේශීය චිකිත්සා (Deshiya Chikitsa)
VI. ප්‍රසූතිතන්ත්‍ර කෞමාරභෘත්‍ය :(Prasutitantra Kaumarabhritya)
VII. ශල්‍ය ශාලක්‍ය (Shalya Shalakya)
VIII. සමාන්තර විද්‍යා (Allied Science)

**2.2 යුනානි අංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

යුනානි අංශය නම් වශයෙන් දෙපාර්තමේන්තු අටකින් (08) සමන්විත වේ.

I. කුල්ලියට් (Kulliat)

II. ඉල්මුල් අඩ්වියා (Ilmul Advia)

III. මෞලිජාට් (Moalejat)

IV. නිස්වාන් වා කබාලට් (Niswan va Quabalat)

V. ඉල්මුල් ජරාහට් (Ilmul Jarahat)

VI. හිෆ්සාන් සේහාට් (Hifzane Sehat)

VII. සමාන්තර විද්‍යා (Allied Science)

VIII. දේශීය ඉලාජ් (Deshiya Ilaj)

**3. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය පිළිබඳ සමාලෝචනයක්**

**3.1 උපාධි අපේක්ෂක ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීම**

| **අංශය** | **පාඨමාලාව** | **මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (අධ්‍යයන වර්ෂයකදී ඇතුළත් කරගැනීම)** |
|---|---|---|
| ආයුර්වේද | BAMS | 150 |
| යුනානි | BUMS | 50 |

ජීව විද්‍යා විෂය ධාරාවෙන් අ.පො.ස උසස් පෙළ විභාගය සමත්වන සිසුන්ගෙන් ආයුර්වේද වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය විද්‍යා සහ යුනානි වෛද්‍ය සහ ශල්‍ය වෛද්‍ය විද්‍යා පිළිබඳ උපාධි වැඩසටහන් වලට ඇතුළත් කර ගැනීමට අදාල තේරීම් කරනු ලබන්නේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසිනි. වැඩසටහන් දෙක සඳහාම වාර්ෂික ඇතුළත් කරගැනීම දළ වශයෙන් ශිෂ්‍යයන් දෙසියයක් (200)වේ.

2011 වර්ෂයේ උපාධි අපේක්ෂකයන් ඇතුළත් කර ගැනීම

**වාර්ෂික ඇතුළත් කර ගැනීම**




ගැහැණු සහ පිරිමි ශිෂ්‍ය අනුපාතය පිළිවෙලින් 133 සහ 37 විය

**ඇතුළත් කර ගැනීම**



**ශිෂ්‍යයන්ගේ විස්තර**

| අංශය | පාඨමාලාව | මාධ්‍යය | ඇතුළත් කර ගැනීම් | 1 වන වර්ෂයේ ශිෂ්‍යයන් | 2 වන වර්ෂයේ ශිෂ්‍යයන් | 3 වන වර්ෂයේ ශිෂ්‍යයන් | 4 වන වර්ෂයේ ශිෂ්‍යයන් | අවසන් වර්ෂයේ ශිෂ්‍යයන් | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආයුර්වේද | බී.ඒ.එම්.එස් | සිංහල ඉංග්‍රීසි | 150 | 143 | 110 | 92 | 80 | 43 | 62 |
| යුනානි | බී.යූ.එම්.එස් | දෙමළ ඉංග්‍රීසි | 50 | 27 | 33 | 28 | 24 | 18 | 09 |
| එකතුව | | | 200 | 170 | 143 | 120 | 104 | 61 | 71 |

2011 වර්ෂයේ දී ඇතුළත් කරගැනීම් ආයුර්වේද අංශය සඳහා ශිෂ්‍යයන් 150 ක් සහ යුනානි අංශය සඳහා ශිෂ්‍යයන් 50 ක් විය. කෙසේ වෙතත් ආයුර්වේද වැඩසටහන සඳහා ශිෂ්‍යයන් 156 දෙනෙක්ද යුනානි වැඩසටහන සඳහා ශිෂ්‍යයන් 24 දෙනෙක්ද ලියාපදිංචි වූහ. යුනානි වැඩසටහන හදාරනු ලබන්නේ මුස්ලිම් ශිෂ්‍යයන් විසිනි. රටෙහි සෑම ප්‍රදේශයකින්ම පැමිණි ආයුර්වේද සහ යුනානි ශිෂ්‍යයෝ ආයතනයේ අධ්‍යාපනය හදාරති.

## 3.2 ඩිප්ලෝමා සහ පශ්චාත් උපාධි වැඩ සටහන්

| වැඩසටහනේ නම | ශිෂ්‍යයන් සංඛ්‍යාව | මාධ්‍යය |
|---|---|---|
| ආයුර්වේද පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 19 | ඉංග්‍රීසි |
| ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 45 | සිංහල |

සමාලෝචනයට බඳුන් වන වර්ෂය අතරතුර ආයුර්වේද පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සහ ආයුර්වේද ඖෂධවේදය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පවත්වන ලදී.

ආයුර්වේද වෛද්‍යපති (MD) (Ayu) පශ්චාත් උපාධි වැඩසටහන සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීමට කටයුතු සම්පාදනය කරන ලදී.

2011 වර්ෂයේදී ආයතනයේ අධ්‍යයන කටයුතුවලට දායක වීම පශ්චාත් උපාධි අංශය විසින් දිගටම කරගෙන යන ලදී.

### 3.3 අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| අංශය | මාධ්‍යය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) |
|---|---|---|---|---|---|
| ආයුර්වේද | සිංහල/ඉංග්‍රීසි | 02 | 22 | 09 | 09 |
| යුනානි | දෙමළ/ඉංග්‍රීසි | - | 11 | 05 | 06 |
| එකතුව | | 02 | 33 | 14 | 15 |

මහාචාර්යවරුන් දෙදෙනෙකු (2) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් තිස්තුන් දෙනෙකු (33) සහ කථිකාචාර්යවරුන් 14 දෙනෙකු සහ පරිවාස කථිකාචාර්යවරුන් 15 දෙනෙකු ඇතුළු ආයුර්වේද සහ යුනානි අංශයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 64න් සමන්විත වේ.

**අධ්‍යයන කාර්ය මණ්ඩලය (ආයුර්වේද සහ යුනානි)**



### 3.4 පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| තනතුර | සංඛ්‍යාව |
|---|---|
| නියෝජ්‍ය ලේඛකාධිකාරී | 01 |
| නියෝජ්‍ය මුල්‍යාධිකාරී | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | 01 |
| සහකාර මුල්‍යාධිකාරී | 01 |
| එකතුව | 04 |

### අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| ශාඛා/අංශ | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කනිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවක |
|---|---|---|---|
| අධ්‍යක්ෂ කාර්යාලය | 02 | | 01 |
| පරිපාලන ශාඛාව | 02 | | |
| පශ්චාත් උපාධි අංශය | | 01 | 01 |
| විභාග සහ ශිෂ්‍ය සුභසාධන ශාඛාව | 03 | 06 | 02 |
| ආයතන | 01 | 01 | 01 |
| මූල්‍ය ශාඛාව | 04 | 02 | 01 |
| පුස්තකාලය | 01 | 05 | 03 |
| ශ්‍රව්‍ය දෘශ්‍ය | 01 | | 01 |
| ආයුර්වේද අංශය | 04 | 04 | 12 |
| යුනානි අංශය | 01 | 02 | 03 |
| එකතුව | 19 | 21 | 25 |

මුළු සාමාජික සංඛ්‍යාව 82 වූ අනධ්‍යයන කාර්ය මණ්ඩලය අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, කළමනාකාර සහායක, තාක්ෂණික සහ තාක්ෂණික නොවන, පුහුණු අර්ධ පුහුණු සහ නුපුහුණු කාර්ය මණ්ඩලය ලෙස පරිපාලන අංශ, අධ්‍යනාංශ, නඩත්තු සහ උද්‍යාන අංශ යටතේ සේවය කරයි.

## 3.5 ජාතික සහ ජාත්‍යන්තර තලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය

1. ඖෂධීය පැළෑටි සහ ඖෂධීය නිෂ්පාදන පිළිබඳ තුන්වන (3) ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICMPHP) - 2011 දෙසැම්බර් 9 සිට 21 දක්වා

නූතන බටහිර වෛද්‍ය ක්‍රමයේ ඖෂධ නිතර දැරිය නොහැකි අති විශාල ජනකාය සඳහා තිරසාර පදනම මත මානව සෞඛ්‍ය කෙරෙහි ඖෂධීය පැළෑටි සහ ඖෂධීය නිෂ්පාදනවල භූමිකාව පිළිබඳ ගැටළු විශාල ගණනක් සාකච්ඡාවට බඳුන් කරමින් පුළුල් පරාසයක පාර්ශ්විකයන් එක් වේදිකාවකට ගෙන එමින් ප්‍රථම වතාවට පැවැත්වූ ඖෂධීය පැළෑටි සහ ඖෂධීය නිෂ්පාදන පිළිබඳ තුන්වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට ප්‍රථම වතාවට අති මහත් ප්‍රතිචාරයක් ලැබුණි. පහත තෝරාගත් තේමා දින තුනේ සම්මන්ත්‍රණයේ දී සාකච්ඡාවට බඳුන් විය.

1. සිද්ධ ආයුර්වේදයෙහි සහ මානව වංශ උද්භිද විද්‍යාවෙහි ඖෂධීය පැළෑටි

2. ඖෂධීය පැළෑටි වගාව, කාබනික ගොවිතැන, ප්‍රචාරණ සංරක්ෂණය

3. අණුක ජීව විද්‍යාව සහ ඖෂධීය පැළෑටිවල ජෛව තාක්ෂණය

4. ඖෂධීය නිෂ්පාදන සහ ඖෂධීය පැළෑටි හා සම්බන්ධ උසස් සායනික පර්යේෂණ

5. ඖෂධීය ආලේපන සහ පෝෂණීය අතිරේක ඖෂධීය ආහාර

6. පේටන්ට් සහ බුද්ධිමය දේපළ හිමිකම්(IPR); තත්ව පාලනය සහ ඖෂධීය නිෂ්පාදන අලෙවිකරණය

"ඖෂධීය පැළෑටි සහ ඖෂධීය නිෂ්පාදන"(ICMPHP) 2011 තුන්වන අන්තර් ජාතික සම්මන්ත්‍රණය සඳහා රටවල් හතකින් (07) ලියාපදිංචි සහභාගිවන්නන් 316 ක් සහභාගි වූ අතර වාචික ඉදිරිපත් කරන්නන් 53 දෙනෙකු සහ ලිඛිත පර්යේෂණ ඉදිරිපත් කරන්නන් 51 දෙනෙකු ඒ සඳහා ඇතුලත් විය.

නියෝජිතයන්, කථිකයන් සහ ඉදිරිපත් කරන්නන්, විද්වතුන්, රාජ්‍ය නොවන සංවිධාන(NGO), ශිෂ්‍යයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, තානාපති කාර්යාල, සහ නිලධාරීන්ගෙන් සමන්විත වූ මෙම සම්මන්ත්‍රණය සාර්ථකව පැවැත්විනි.

**මෙම අන්තර්ජාතික සම්මන්ත්‍රණයේ (ICMPHP) නිර්දේශ**

1. දේශීය සාම්ප්‍රදායික දැනුම ලේඛනගත කිරීම සහ ග්‍රාමීය ප්‍රජාවගේ තොරතුරු සැපයීමට දත්ත සංචිතයක් වැඩි දියුණු කිරීම

2. ඖෂධීය පැළෑටි සංරක්ෂණය සඳහා යෝග්‍ය ස්ථාන හඳුනා ගැනීම සහ වනාන්තර තුළ සහ ජෛව ගම්මාන සංකල්පය ව්‍යාප්ත කරමින් කෘෂිකාර්මික වනාන්තර පරිසර පද්ධතිය කළමනාකරණය කිරීම

3. ගෝලීයව පාරිභෝගිකයන්ගේ විශ්වාසනීයත්ව මට්ටම වැඩි කිරීම පිණිස ඖෂධීය බෙහෙත් ක්‍රමවත්ව සැකසීමේ සහ නිෂ්පාදනයේ ගුණාත්මකභාවය ඉහළ දැමීම සඳහා පර්යේෂණ ඇරඹීම සහ දිරිමත් කිරීම

4. ශිෂ්‍යයන්ගේ සිට වාණිජමය ප්‍රයෝජනය ලබන්නන් සහ පර්යේෂකයන් යන සියළුම මට්ටම් සඳහා සියළු සහභාගිවන රටවල් ජාලයෙහි වාර්ෂිකව ඖෂධීය පැළෑටි සහ ඖෂධීය නිෂ්පාදන අවබෝධතා ව්‍යාපාර පැවැත්වීම

5. ශිෂ්‍යයන්, ගුරු භවතුන්, ගොවියන්, ගෝත්‍රික රෝග සුවකරන්නන් සහ ඖෂධීය නිෂ්පාදන නිපදවන්නන්ට ගැළපෙන අධ්‍යාපනික පුහුණු මොඩියුල වැඩි දියුණු කිරීම

**2. 2011 දෙසැම්බර් 19 සිට 22 දක්වා පැවැත් වූ ආයු මෙඩිකා (Ayu Medica) ප්‍රදර්ශනය**

වර්ෂ 25 කට පසු දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය ජාතික මට්ටමේ ප්‍රදර්ශනයක් සංවිධානය කිරීමට සමත් විය.

1. නව සහස්‍රය සඳහා ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ ගමන් මාර්ගය පෙන්වා දීම
2. ආයුර්වේදීය ජන සමූහය සහ ආයුර්වේදීය ජීවන රටාව අභිප්‍රේරණය කිරීම එහි මූලික අරමුණ විය.

ප්‍රදර්ශන කුටි : පහත දැක්වෙන පරිදි ආයුර්වේද සහ යුනානි දෙපාර්තමේන්තු 08 යටතේ ප්‍රදර්ශන කුටි 45 ක් තිබුණි.

| | | | |
|---|---|---|---|
| 1. | 1 වන අංශය | - | මූලික සංකල්ප |
| 2. | 11 වන අංශය | - | ව්‍යුහ විද්‍යාව සහ කායික විද්‍යාව |
| 3. | 111 වන අංශය | - | ස්වස්ථවෘත්ත (ප්‍රජා වෛද්‍ය විද්‍යාව) |
| 4. | IV වන අංශය | - | මැටීරියා මෙඩිකා |
| 5. | V වන අංශය | - | ස්ත්‍රී රෝග / කෞමාරභෘත්‍ය |
| 6. | VI වන අංශය | - | දේශීය චිකිත්සා |
| 7. | VII වන අංශය | - | නිදාන චිකිත්සා |
| 8. | VIII වන අංශය | - | ශල්‍ය / ශාලක්‍ය |

අමතර ප්‍රදර්ශන කුටි

1. ආයුර්වේද සෞඛ්‍ය ශොභාගාර (ස්පා) ශාලාව
2. යෝග සහ භාවනා ප්‍රදර්ශන ශාලාව
3. චීන කටු චිකිත්සා ප්‍රදර්ශන ශාලාව
4. ගිනි අවි අනතුරු (ශ්‍රී ලංකා යුධ හමුදාව) ප්‍රදර්ශන ශාලාව
5. ශ්‍රී ලංකා මත්ද්‍රව්‍ය නිවාරණ කාර්යාංශ ප්‍රදර්ශන ශාලාව
6. සත්වෝද්‍යාන ප්‍රදර්ශන ශාලාව
7. දේශීය චාරිත්‍ර ක්‍රම ආදිය පිළිබඳ ප්‍රදර්ශන ශාලාව

ප්‍රදර්ශන ද්‍රව්‍ය සහ ක්‍රම විධි

1. අත් පත්‍රිකා
2. වීඩියෝ
3. නිදර්ශක
4. ආදර්ශ
5. පෝස්ටර්
6. පොත් / පොත් පිංච
7. ඖෂධීය පැළෑටි
8. දේශීය ආහාර අයිතම
9. ඉදිරිපත් කිරීම් යනාදිය

සමාරම්භ කරන ලද්දේ

ගරු එස්. බී. දිසානායක මැතිතුමා - උසස් අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු සාලින්ද දිසානායක මැතිතුමා - දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

මහාචාර්ය ගාමිණී සමරනායක මහතා - සභාපති - විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම

මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මිය - උපකුලපතිනිය / කොළඹ විශ්ව විද්‍යාලය

මහාචාර්ය සුදාසිනම් ගුඩිවාද - ලේකම් / වෙන්කටේෂ්වර විශ්ව විද්‍යාලය - ඉන්දියාව

ගරු අශෝක් කේ. කාන්ත - ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස්

වෛද්‍ය ආර්. ඒ. ජයසිංහ මහතා - අධ්‍යක්ෂ / දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය

### 3.6 පර්යේෂණ,නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| විෂයය | ප්‍රකාශයට පත් කළ | ඉදිරිපත් කළ |
|---|---|---|
| පර්යේෂණ සංඛ්‍යාව | 25 | 14 |
| නව සොයා ගැනීම් | 01 | |
| ජර්නල් සංඛ්‍යාව | 01 | |
| පොත් සංඛ්‍යාව | | |
| ලිපි සංඛ්‍යාව | 02 | |
| වෙනත් | | |
| එකතුව | 29 | 14 |

**පර්යේෂණ හා ප්‍රකාශන - යුනානි අංශය 2011**

1. Nazla (Allergic Rhinitic) සඳහා පිළියෙල කරන ලද යුනානි ඖෂධ සංයෝගයක චිකිත්සීය සායනික සඵලතාවය ඇගයීම
   වෛද්‍ය එම්.එල්.යූ. සල්මා, වෛද්‍ය එම්.එම්.එස්.ෆවුමියා

2. Glinus Oppositil ශාඛයේ පෝෂණීය හා ශාක නිස්සාරකයේ රසායනික සංඝටකයන් ඇගයීම
   වෛද්‍ය එම්.එන්.එෆ්.රිස්නියා

3. හාතවාරිය චූර්ණයේ හා Asal-e-Soos යන සංයෝගය ජෝනාශ (Menopausal symptoms) ලක්ෂණ කෙරෙහි ඇති කාර්යභාරය
   වෛද්‍ය එච්. නිසාම්දීන්, වෛද්‍ය එම්.එච්. ෆස්ලූල් හග්

4. Naslar Har රෝගය සඳහා යුනානි ඖෂධ සංයෝගයක ඇති සඵලතාවය
   වෛද්‍ය ඒ.එච්.ඒ. ෆසීනා

5. ජ්වරය සඳහා Daf-e- Humma ඖෂධය කාර්යක්ෂමව යෙදීම පිළිබඳව සාහිත්‍යයික විමර්ශනය
   වෛද්‍ය එම්.එම්.එම්. රිෆායි

6. ශල්‍ය සඳහා Musakkin e Alam ඖෂධය කාර්යක්ෂම යෙදීම පිළිබඳව සාහිත්‍යයික විමර්ශනය
   වෛද්‍ය ඒ.එච්.එම්. මවුප්‍රුඩ්

7. Asalusoos හා ශතාවරි Perimenopausal syndrome හි යෙදීම පිළිබඳව සංසන්දනාත්මක අධ්‍යයනයක්
   වෛද්‍ය එම්. මූ.ඉසෙඩ්.එන්. ෆර්සානා

8. මේදෝවෘද්ධිය සඳහා සංස්කරණය කරන ලද යුනානි ඖෂධයක සංසන්දනාත්මක සායනික අධ්‍යයනය විශේෂ විමර්ශන නව්‍ය ඖෂධයක් ඇසුරින් (Aforvastatin)
   වෛද්‍ය එම්.ඒ.ඒ. සිරාජුඩීන්

9. Tukhm-e- khatmi සහ Tukhm-e- kharbuza යන ඖෂධ දෙකෙහි ප්‍රමිතිකරණය හා වෘක්ත ආරක්ෂිත ක්‍රියාකාරිත්වය පිළිබඳව Albino rats යොදා ගනිමින් අධ්‍යයනය කිරීම
වෛද්‍ය එන්. ෆහමියා

10. ජානුසන්ධි සන්ධිගත වාත (knee osteoarthritis ) කෙරෙහි ජලෞකාවරණ පිළිබඳව සායනික ඇගයීම
වෛද්‍ය එම්.එස්.එම්. ෂිෆා

11. “Herbs in Unani” යන ග්‍රන්ථය සැකසෙමින් පවතී
වෛද්‍ය බී.එම්. නජීබ්

12. POS හේතුවෙන් ඇති වූ hirsuitism සඳහා ඒකීය ශාක චූර්ණයක කාර්යක්ෂමතාව ඇගයීම
වෛද්‍ය එස්. එම්. රයිසුඩීන්

13. pakhanbed ඖෂධයෙහි මධුමේහ තත්වයෙහි රුධිර ග්ලූකෝස් සාන්ද්‍රණයෙහි අඩු වීම පිළිබඳව සත්ව නිදර්ශකයක් භාවිතයෙන් ඇගයීම
වෛද්‍ය එම්. එස්. එම්. නස්මීර්

14. Zukam vo Nazia ප්‍රතිකාරයේදී shifa hair oil හි කාර්යභාරය
වෛද්‍ය එම්.එච්.එම්. හෆීල්

15. “Aanmiha ulavial- a new guidline” යන ග්‍රන්ථය
වෛද්‍ය එම්.සී.එම්. මහීස්

16. Introduction to Al- umoor Althabayeeya-
වෛද්‍ය එම්. එච්.එම්. නසීම්

17. ශ්‍රී ලංකාවේ Type 11 Dm රෝගීන් සුලභව භාවිතා කරන ආහාර රටාවන් රුධිරයේ සීනි සාන්ද්‍රණයට ඇති බලපෑම (ශ්‍රී ලංකාවේ මධුමේහ රෝගීන්ගේ ආහාර රටාව පිළිබඳ අධ්‍යයනය)
වෛද්‍ය ඒ. එම්. මුතාලිබ්

18. කාන්තා අතිස්ථෞල්‍ය පිළිබඳව තෝරා ගත් පාරම්පරික ආහාර හා ව්‍යායාම පිළිබඳව සහ යුනානි ආහාර උපදෙස් මාලාව විමර්ශනාත්මක අධ්‍යයනය කිරීම
වෛද්‍ය එම්. අයි. මනුහා

**3.6 පර්යේෂණ හා ප්‍රකාශන - ආයුර්වේද අංශය 2011**

- **මහාචාර්ය ඒ.පී.ජී.අමරසිංහ**

1. ඒ.පී.ජී. අමරසිංහ "ළමා රෝග සඳහා භාවිතා කරන ලද ශ්‍රී ලාංකේය දේශීය ඖෂධ යෝගයක් වන රත කල්කය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයන" දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳ ශ්‍රී ලාංකේය වාර ප්‍රකාශනය 2011; 01(01): (පිටු අංක 44-48)

2. ඒ.පී.ජී. අමරසිංහ "ශ්‍රී ලාංකේය දේශීය වෛද්‍ය ක්‍රමය සහ ආයුර්වේදයේ ප්‍රගමනය සඳහා අධ්‍යාපනය" ආර්ථික විමසුම. වෙළුම 37 අංක 07 සහ 08 2011 ඔක්තෝබර්/නොවැම්බර්,
(පිටු අංක 26-28)

3. ඩබ්.ඒ.ඒ.එස්. වීරකෝන්, මහාචාර්ය ඒ.පී.ජී.අමරසිංහ "බාලක පක්ෂාගාත රෝගය සඳහා තෝරාගත් ආයුර්වේද ප්‍රතිකාර පද්ධතියක සාඵල්‍යතාව ඇගයීම" ඖෂධ පැළෑටි පිළිබඳ තුන්වැනි ජාත්‍යන්තර සමුළුව 2011 දෙසැම්බර් 19-21, දේශීය වෛද්‍ය විද්‍යාආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය.
(පිටුව 34)

4. බී.එම්. නජීබ්, ඒ.පී.ජී. අමරසිංහ සහ එස්. විදානපතිරණ "විවෘත වෙළඳ පලේ සුලභව හමුවන විවිධ ආයුර්වේද ඖෂධ සංයෝගවල ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මක තත්ව ඇගයීම" ඖෂධ පැළෑටි පිළිබඳ තුන්වැනි ජාත්‍යන්තර සමුළුව. 2011 දෙසැම්බර් 19-21, දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය.
(පිටුව S-3)

5. සරෝජා වීරකෝන්, ඒ.පී.ජී. අමරසිංහ "මස්තිස්ක ආඝාත ජන්‍ය බාලක පක්ෂාඝාත රෝගය පිළිබඳව ආයුර්වේද ප්‍රතිකාරයක ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීම" දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳ ශ්‍රී ලාංකේය වාර ප්‍රකාශනය 2011; 01(02)፡
(පිටු අංක 55-58)

- **වෛද්‍ය පී.කේ. පෙරේරා**

1. ඊෂන් ප්‍රුවන්බී ඖෂධ ආතරයිටිස් රෝගය සඳහා සාඵල්‍යතාවය-එත්නෝපාමකොලොජි සඟරාව (පිටු අංක 134, 171-175)
2. දියවැඩියා රෝගයට ක්‍රියාකාරි ආහාරයක් ලෙස හතුවල බලපෑම- සෞඛ්‍ය සහ රෝග සඳහා ක්‍රියාකාරී ආහාර පිළිබඳ සඟරාව
3. ක්‍රියාකාරී ආහාර පිළිබඳ අධ්‍යයනය -2011 මාර්තු මස ඇමෙරිකාවේ පැවත් ජාත්‍යන්තර සමුළුව

- **මහාචාර්ය ඊ.ආර්.එච්.එස්.එස්. එදිරිවීර**

1. හිමොන්කස් කොන්ටෝටස් සඳහා තෝරා ගත් ඖෂධීමය ශාඛවල සාඵල්‍යතාව -3 වන ජාත්‍යන්තර සමුළුව ඖෂධ පැළෑටි සහ ශාඛ නිෂ්පාදන පිළිබඳ
2. සුදු කබර රෝගයට බාකුචි තෛල හා හරිතල යෝග පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනය -3 වන ජාත්‍යන්තර සමුළුව ඖෂධ පැළෑටි සහ ශාඛ නිෂ්පාදන පිළිබඳ
3. රත්නපුර දිස්ත්‍රික්කය ජෛව විවිධත්වය නිසා අධි පෝෂණයෙන් ගුණයෙන් යුත් ආහාරවලින් පෝෂිත වේ -පරිසර ප්‍රකාශන, පරිසර අමාත්‍යංශය (පිටු අංක 56-69)
4. සොබා රුව නසන හම සුදුවන රෝගයට පරිසරයෙන් පිළියම් -පරිසර ප්‍රකාශන -2011 (පිටු අංක 53-55)
5. දේශීය ධාන්‍ය සහ ඉන් ලැබෙන ප්‍රයෝජන -පරිසර ප්‍රකාශන -2011 (පිටු අංක 40-47)
6. පක්ෂාගාතයට චන්ද්‍ර කල්කය සහ මහදළු අනුපානයේ සාඵල්‍යතාව පිළිබඳ සායනික පර්යේෂණ- ආයුර්වේද සඟරාව -2011 (වෙළුම 32 පිටු අංක 25-29)
7. වල්කොත්තමල්ලි කෂායේ ලේ ගැටිති කෙරෙහි බලපාන අන්දම- ආයුර්වේද සඟරාව (වෙළුම 32 පිටු අංක 271-274)

**3.7 වැඩ සටහන් ,සම්මන්ත්‍රණ සහ වැඩ මුළු පිළිබඳ විස්තර**

| විෂයය | පවතින | අවසන් කළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| පශ්චාත් උපාධි සංඛ්‍යාව | 01 | | 01 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | 02 | | |
| උපාධි වැඩසටහන් සංඛ්‍යාව | 02 | | |
| ඩිප්ලෝමා වැඩ සටහන් සංඛ්‍යාව | | | |
| සහතික පත්‍ර වැඩසටහන් සංඛ්‍යාව | | | 01 |
| එකතුව | 05 | | 02 |

**3.8 පුස්තකාලය**

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ පුස්තකාලය ආයතනයේ ආරම්භක අවධිය වන 1929 තරම් ඈත කාලය තෙක් දිවේ. වටිනා ආයුර්වේද සහ යුනානි වෛද්‍ය ග්‍රන්ථවලින් සමන්විත මෙම පුස්තකාලයේ පරිපාලනය

1. ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති සහ

2. සහකාර පුස්තකාලයාධිපති සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් සිදු වේ.

එය ප්‍රධාන අංශ හයක් (06) ක් යටතේ ක්‍රියාත්මක වේ.

1. බැහැර දෙන අංශය

2. විමර්ශන අංශය

3. සඟරා අංශය

4. පර්යේෂණ අංශය

5. පුස්කොළ පොත් අංශය

6. පොත් බැඳීමේ අංශය  වශයෙනි

මෙම පුස්තකාලයේ විශේෂම අංශය වන්නේ පුස්කොළ පොත් අංශයයි. එහි වටිනා ආයුර්වේද රෝග නිවාරණ සහ ඖෂධ වට්ටෝරු අඩංගු පුස්කොළ පොත් රාශියක් පවතින අතර ඒවායේ වටිනාකම මිල කල නොහැක. මෙම පොත් සංරක්ෂණය සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව දැනටමත් වැඩපිළිවෙලක් සකස් කර ඇත. එසේම වටිනා දුර්ලභ ආයුර්වේද වෛද්‍ය සහ යුනානි වෛද්‍ය පොත්වල සහ ජාතික සහ ජාත්‍යන්තර සඟරාවල එකතුවක්ද මෙහි ඇත. ඒවා උපාධි සහ පශ්චාත් උපාධි සිසුන්ගේද විවිධ පර්යේෂණවල නිරත වන ආයුර්වේද සහ යුනානි විද්වතුන්ගේද ප්‍රයෝජනය සඳහා විශාල පිටිවහලක් වී ඇත.

### 3.9 දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ ශ්‍රී ලාංකේය වාර ප්‍රකාශනය (SLJIM)-2011

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය විසින් දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය පිණිස ඉදිරිපත් කරනු ලබන සඟරාව දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳව ශ්‍රී ලංකා සඟරාව (Sri Lanka Journal of Indigenous Medicine) ලෙස හැඳින්වේ.

මෙම සඟරාවේ සංස්කාරක මණ්ඩලය වන්නේ

ප්‍රධාන සංස්කාරක - මහාචාර්ය ඒ.පී.ජී. අමරසිංහ
සහය සංස්කාරක - ආචාර්ය එච්.ඒ.එස්. ආරියවංශ
ආචාර්ය ඒ.එච්.එම්.මව්ජූඩ්
වෛද්‍ය ඩී.පී.ඒ.දිසානායක

සංස්කාරක මණ්ඩල සාමාජිකයින් - ආචාර්ය බී.එම්.නජීබ්
වෛද්‍ය එස්.ඩී.හපුආරච්චි
ආචාර්ය කේ.බී.ජයවර්ධන

(වෙළුම 01 කලාපය - 02 පිටු අංක 51-99 2011 දෙසැම්බර් ISSN 2012 – 9238)

| පර්යේෂණ/ප්‍රකාශන මාතෘකාව | පිටුව | ආචාර්යවරයාගේ නම |
|---|---|---|
| ආමලාක්‍යාදි රසායනය සහ එහි අනුපානවල ආමාශ ආරක්ෂක ක්‍රියා පිළිබඳ පර්යේෂණාත්මක ඇගයීම | 51 | වෛද්‍ය එස්.එම්.එස්. සමරකෝන්<br>වෛද්‍ය එස්.කේ.එම්.කේ. හැරපත්දෙනිය<br>වෛද්‍ය එස්.එම්. චන්ඩෝලා<br>වෛද්‍ය බී. රවිශංකර් |
| බාලක පක්ෂඝාත රෝගය සඳහා ආයුර්වේද චිකිත්සා පද්ධතියක සාඵල්‍යතාව අධ්‍යයනය | 55 | මහාචාර්ය ඒ.පී.ජී. අමරසිංහ<br>වෛද්‍ය සරෝජා වීරකෝන් |
| ප්‍රාථමික කෂ්ටරජස් රෝගය පාලනය කිරීම සඳහා දශමූල බලා තෛල මාත්‍රා වස්තියේ සායනික සාඵල්‍යතාව | 59 | වෛද්‍ය කෞමදී කරුණාගොඩ<br>වෛද්‍ය ශිල්පා ඩොන්ගා<br>වෛද්‍ය ලක්ෂ්මි ප්‍රියාදේයි |
| ඇත්තෝර පත්‍ර විවිධ මද්‍යසාරීය රසසාරවල බැක්ටීරියා නාශක ගුණය පිළිබඳ ඇගයීම | 64 | ආචාර්ය ක්‍රිස්ටි ජයසිලන්<br>ආචාර්ය එස්. තර්මිලා<br>ආචාර්ය ඒ.සී. නවරත්නම් |
| සැවැන්දරා ශාඛයේ මනාවර්ධනය සහ තෛල නිපදවීම සඳහා වඩාත් සුදුසු වගා ක්‍රම තේරීම | 70 | ආචාර්ය එස්. සුබසිංහ<br>ආචාර්ය එන්.ඩී.එන්. ප්‍රියදර්ශනී<br>ආචාර්ය එම්.ටී.කේ. අමරසිංහ<br>ආචාර් අයි.ආර්. පලිහක්කාර |
| මීයන්ගේ රුධිරයේ තෙල අධිකතාවට විරුද්ධව වරා ආසනාදී ක්වාථයේ ක්‍රියාකාරිත්වය | 76 | ආචාර්ය අත්ප්‍රි පී රාමචන්ද්‍රන්<br>ආචාර්ය බී. රවිශංකර්<br>ආචාර්ය සියාම් ප්‍රසාද්<br>ආචාර්ය විජේකුමාර්<br>ආචාර්ය බී.කේ. අශෝක් |
| "ඇකුමස්" මුඛ පිරිසිදු කාරකයේ බැක්ටීරියා නාශක ගුණය | 83 | ආචාර්ය එස්. තර්මිලා<br>ආචාර්ය ටී. තිලීපන්<br>ආචාර්ය ඒ.සී. නවරත්නම්<br>ආචාර්ය ආර්. ශ්‍රී කරන් |

| | | |
|---|---|---|
| රූමැටොයිඩ් ආතරයිටිස් රෝගයේ තෝරා ගත් සයිටොකින් ඉලක්ක වශයෙන් ප්‍රතිරූමැටික යී ජූන් බී (YJB) ශාඛ ඖෂධ සංයෝගයේ ක්‍රියාකාරිත්වය | 86 | ආචාර්ය කමල් පෙරේරා<br>ආචාර්ය යුන්මාන් ලී |
| මානසික සෞඛ්‍ය ප්‍රාණවත් කිරීමේ ලා සාක්ෂ්‍ය පාදක ආයුර්වේදය | 91 | ආචාර්ය නිෂා ඕජා<br>ආචාර්ය අබිමණ්ඩු කුමාර් |

## 4. ජාත්‍යන්තර සබඳතා

1. චීනයේ ටෝග්ශාන්හි හෙබෙයි එක්සත් විශ්වවිද්‍යාලය සමග අත්සන් කළ අවබෝධතා ගිවිසුම

දේශීය වෛද්‍ය ආයතනය සහ චීනයේ හෙබෙයි එක්සත් විශ්ව විද්‍යාලය අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුම යටතේ 2009.08.29 සිට 2011.11.08 දක්වා ත්‍රෛමාසික කෙටිකාලීන නේවාසික පුහුණු වැඩසටහනක් සඳහා දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් පස් දෙනෙකු සහභාගි විය.

2. ඉන්දියාවේ හැම්ඩාර්ඩ් විශ්ව විද්‍යාලය සමගින් අත්සන් කළ අවබෝධතා ගිවිසුම

යුනානි වෛද්‍ය පාඨමාලා වැඩි දියුණු කිරීමට සහාය ලබාගැනීමට යුනානි වෛද්‍ය අංශය ඉන්දියාවේ හැම්ඩාර්ඩ් විශ්ව විද්‍යාලය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

## 5. මූල්‍ය සහ ගිණුම්

### 5.1.මූල්‍ය සමාලෝචන - 2011

| විෂයය | 2010 රු. | 2011 රු. |
|---|---:|---:|
| අ. පුද්ගල පාරිශ්‍රමික | 89,817.00 | 109,361,139 |
| ආ.ගමන් වියදම් | 133,800 | 1,371,217 |
| ඇ.සැපයුම් | 5,804,530 | 4,997,243 |
| ඈ.නඩත්තු | 1,850,759 | 1,598,880 |
| ඉ.කොන්ත්‍රාත් සේවා | 14,929,008 | 14,458,765 |
| ඊ.වෙනත් | 4,227,472 | 2,528,446 |
| එකතුව | 116,813,366 | 134,315,690 |

### ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂයය | 2010 | 2011 |
|---|---:|---:|
| අ. ලී බඩු සහ කාර්යාල උපකරණ අත්පත් කර ගැනීම් | 2,450,946 | 5,766,298 |
| ආ. යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම් | 2,799,314 | 350,000 |
| ඇ. ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත්පත් කර ගැනීම් | 5,250,260 | 21,459,165 |
| එකතුව | | |

සටහන:

IRQUE ව්‍යාපෘතිය මගින් ප්‍රදානය කරන ලද රු.10,820,386 වටිනා උපකරණ සහ රු.525,722 වටිනා පොත් ප්‍රදානයන් 2011 වර්ෂික ගිණුම්වල ඇතුලත් කර ඇත.

**මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (වියදම්)**

| විෂයය | 2011 ප්‍රතිපාදන රු. | 2011 වියදම් රු. | ඉතුරුම්/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන | 152,460,448 | 146,100,878 | 6,359,570 |
| ආ.ව්‍යාපෘති හැර ප්‍රාග්ධන | 25,000,000 | 21,459,165 | 3540,835 |
| ඇ.ව්‍යාපෘතිය-දේශීය අරමුදල් සැපයූ | - | - | - |
| ඈ.ව්‍යාපෘතිය- විදේශීය අරමුදල් සැපයූ | - | - | - |
| එකතුව | 177,460,448 | 167,560,043 | 9,000,405 |

**මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ඉපැයූ ආදායම)**

| ආදායම් ප්‍රකාශය | 2011 ප්‍රතිපාදන රු. | 2011 වර්ෂයේ එකතුව රු. | හිඟය/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. උපාධි අපේක්ෂක අධ්‍යයන | - | - | - |
| ආ. පශ්චාත් උපාධි අධ්‍යයන | 2,090,000/- | 1,273,741/- | (816,259) |
| ඉ. උපදේශක සේවා | | | |
| ඊ. වෙනත් ආයුර්වේද ඖෂධ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 1,750,000 | 700,000 | (1,050,000) |

**මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය -2011**

| විෂයය | සංකේතය | එක් ශිෂ්‍යයකු සඳහා වියදම රු. |
|---|---|---|
| අ.ශිෂ්‍යයකුගේ පුනරාවර්තන වියදම (RE) | 628/146,100,878 | 232,644 |
| ආ.ශිෂ්‍යයකුගේ ප්‍රාග්ධන වියදම (CE) | | 34,170 |

# දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,

# කොළඹ විශ්වවිද්‍යාලය

# අවසන් ගිණුම්

# 2011

*විගණකාධිපති,*

*විගණකාධිපති දෙපාර්තමේන්තුව,*

*නිදහස් චතුරශ්‍රය,*

*කොළඹ 7.*

*මහත්මයාණෙනි,*

***<u>2011 වසර සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (සංශෝධිත) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.</u>***

*1978 අංක 7 දරණ සංශෝධිත පනත සහ 1971 අංක 38 දරණ මූල්‍ය පනත ප්‍රකාරව සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106 (1) (2) සහ 107 (ආ) වගන්ති ප්‍රකාරව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (සංශෝධිත) මූල්‍ය ප්‍රකාශන මා ඉදිරිපත් කරන්නේ මහත් සතුටිනි.*

*රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ පීඑෆ්/පීජී/21 හි 3(ආ) වගන්තිය සහ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106 (1) (2) සහ 107 (ආ) වගන්තිය විසින් අවශ්‍ය වන පරිදි නියම කර ඇති කාල සීමාව තුළ දී 2011 වර්ෂය සඳහා (සංශෝධිත) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ.*

*ස්තුතියි,*

*මෙයට විශ්වාසී,*

*සුනිමල් සේනාරත්න,*

*අධ්‍යක්ෂ,*

*දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,*

*කොළඹ විශ්වවිද්‍යාලය.*

*පිටපත්*

1. *ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය*
2. *සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම*
3. *උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය*
4. *අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව*
5. *විගණන අධිකාරි, මහජන පුස්තකාලය*
6. *ප්‍රධාන අභ්‍යන්තර විගණක, අභ්‍යන්තර විගණන අංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම*

**අන්තර්ගතය**

**<u>I - කොටස</u>**

01 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

02 මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රකාශය

03 ශුද්ධ වත්කම් හි වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

04 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

05 ශේෂ පිරික්සුම

**<u>II - කොටස</u>**

06 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයට සටහන්

07 මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රකාශයට සටහන්

08 ශුද්ධ වත්කම් හි වෙනස්වීම පිළිබඳ ප්‍රකාශයට සටහන්

09 මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සටහන්

10 මූල්‍ය ප්‍රකාශන වලට උප ලේඛණ (A සිට J)

11 බැංකු සැසඳුම

12 අයවැය වෙන්කිරීම

13 මූල ප්‍රකාශයට සටහන්

**දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය-කොළඹ විශ්වවිද්‍යාලය**
**මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**
**2011 දෙසැම්බර් 31 වන දිනට**

| | සටහන් | 2011<br>රුපි. | 2011<br>රුපි. | 2010<br>රුපි. | 2010<br>රුපි. |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම-නොවන වත්කම්** | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 1 | 1,476,095,128 | | 108,745,969 | |
| ආයෝජන (දිගු.කා) | 2 | 228,218 | | 122,116 | |
| වෙනත් වත්කම් | 3 | 2,825,122 | | 2,955,781 | |
| නොනිමි වැඩ | | 0 | | 0 | |
| | | | **1,479,148,468** | | **111,823,866** |
| **ජංගම වත්කම්** | | | | | |
| ගබඩා අත්තිකාරම් ගිණුම | | 1,655,564 | | 884,430 | |
| ලැබිය යුතු දේ | 4 | 23,363,435 | | 23,494,986 | |
| බංකුවේ ඇති මුදල් | 5 | 10,072,054 | | 6,613,608 | |
| **මුලු වත්කම්** | | | **35,091,053** | | **30,993,024** |
| | | | **1,514,239,521** | | **142,816,890** |
| **වගකීම්** | | | | | |
| **ජංගව වගකීම්** | | | | | |
| ගෙවිය යුතු දේ | 6 | 7,078,842 | | 5,421,011 | |
| විලම්බිත අදායම් | 7 | 1,924,981 | | | |
| උපචිත වියදම් | 8 | 1,538,128 | | 2,198,500 | |
| | | | **10,541,951** | | **7,619,511** |
| **ජංගම-නොවන වගකීම්** | | | | | |
| පාර්තොෂික සඳහා වෙන්කිරීම් | | 39,119,818 | | 13,902,165 | |
| | | | **39,119,818** | | **13,902,165** |
| **මුලු වගකීම්** | | | **49,661,769** | | **21,521,676** |
| **මුලු ශුද්ධ වත්කම්** | | | **1,464,577,752** | | **121,295,214** |
| **ශුද්ධ වත්කම් / හිමිකරු ප්‍රාග්ධනය** | | | | | |
| ප්‍රාග්ධන ප්‍රධාන - වැය කළ | 9 | 190,830,053 | | 242,689,849 | |
| නොනිමි වැඩ | | | | 0 | |
| ප්‍රාග්ධන ප්‍රධාන - වැය නොකළ | | 5,248,465 | | 5,663,245 | |
| පොදු සංචිතය | 10 | -115,056,586 | | -138,487,746 | |
| සමුච්චිත අරමුදල | 11 | 1,383,555,820 | | 11,429,866 | |
| | | | **1,464,577,752** | | **121,295,214** |
| **මුලු ශුද්ධ වත්කම් / හිමිකරු ප්‍රාග්ධනය** | | | **1,464,577,752** | | **121,295,214** |

සහතික කර නිවැරදි කරන ලදී

| | | |
|---|---|---|
| සුනිමල් සේනාරත්න<br>අධ්‍යක්ෂ | එස්. සිරිමාන්න<br>නියෝජ්‍ය මූල්‍යාධිකාරී | එල්.එල්. ඩබ්ලිව්. පෙරේරා<br>නියෝජ්‍ය ලේඛකාධිකාරී |

**දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය-කොළඹ විශ්වවිද්‍යාලය**
**2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය**

| | සටහන් | 2011 | 2010 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | රු.පි | රු.පි |
| පුනරාවර්තන ප්‍රදාන | | 139,220,104 | 104,100,000 |
| පුනරුත්තාපන වැඩිදියුණු කිරීම සඳහා රාජයේ ප්‍රදාන | | 835,712 | |
| රජයේ ප්‍රධාන - මහපොල භාරකාර අරමුදල | | 3,605,550 | 2,487,550 |
| රජයේ ප්‍රධාන - මහපොල- UGC | | 730,100 | 1,382,500 |
| රජයේ ප්‍රධාන - ශිෂ්‍යාධාර- UGC | | 4,612,950 | 4,538,700 |
| වෙනත් ආදායම් | **12** | 5,326,443 | 1,798,041 |
| ක්‍රමක්ෂය | | 24,455,028 | |
| | | **178,785,887** | **114,306,791** |
| **මෙහෙයුම් වියදම්** | | | |
| පොදු පරිපාලන | **13** | 49,101,908 | 49,604,297 |
| අධ්‍යයන සේවා | **14** | 83,631,775 | 65,258,641 |
| පුස්තකාල සේවා | **15** | 7,217,081 | 6,562,438 |
| නේවාසිකාගාර | **16** | 3,242,529 | 4,075,940 |
| පශ්චාත් උපාධි වියදම් | | 2,036,183 | 604,569 |
| බයිසජ්ජා වියදම් | | 1,253,741 | |
| ක්ෂය සහ ක්‍රමක්ෂය කිරීමේ වියදම් | | 26,639,718 | 14,242,657 |
| පාරිතෝෂික සඳහා වෙනකිරීම් වල වැඩිවීම | | 30,258,274 | 12,208,291 |
| පර්යේෂණ වියදම්-ලෝ.ස.ස. | | 16,560 | 46,440 |
| විගණන ගාස්තු | | 400,000 | 545,717 |
| පුනරුත්තාපන සහ වැඩිදියුණු කිරීමේ වියදම් | | 835,712 | |
| **මුලු මෙහෙයුම් වියදම්** | | **204,633,481** | **153,148,990** |
| **මෙහෙයුම් ක්‍රියකාරකම් වලින් අතිරික්තය / (හිඟය)** | | **-25,847,594** | **-38,842,199** |

එස්. සිරිමාන්න මහතා
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය-කොළඹ විශ්වවිද්‍යාලය

**2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා**

ශුද්ධ වත්කම් හි වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

| | සටහන් | පොදු | ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රාග්ධනය | ප්‍රත්‍යාගණන | සමුච්චිත | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | | සංචිතය | වැය කළ | වැය නොකළ | සංචිතය | අරමුදල | |
| | | රුපි. | | | රුපි. | | රුපි. |
| **2009 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | -99,595,704 | 236,944,536 | 5,663,245 | 0 | | 143,012,077 |
| | | | 5,745,313 | | | | 5,745,313 |
| මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය තුළ | | | | | | | |
| .-හඳුනා නොගත් ශුද්ධ ආදායම් සහ පාඩු | | -49,843 | | | | | -49,843 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය / (හිඟය) | | -38,842,199 | | | | | -38,842,199 |
| ක්‍රමක්ෂය | | | | | | | |
| **2010 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | -138,487,746 | 242,689,849 | 5,663,245 | 0 | 11,429,866 | 121,295,214 |
| | | | | | | | |
| දේපළ ප්‍රත්‍යාගණනය මත අතිරික්තය/(හිඟය) | | | | | 1,361,888,931 | | 1,361,888,931 |
| ක්‍රමක්ෂය | | 47,335,571 | -71,790,599 | | | | -24,455,028 |
| වත්කම් අත්පත් කර ගැනීම | | | 19,930,803 | | | | 19,930,803 |
| ලැබීම් | | | | 20,360,830 | | 10,237,023 | 30,597,853 |
| වියදම් | | | | -20,775,610 | | | -20,775,610 |
| මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය තුළ | | | | | | | |
| .-හඳුනා නොගත් ශුද්ධ ආදායම් සහ පාඩු | **17** | 1,943,183 | | | | | 1,943,183 |
| | | | | | | | |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය / (හිඟය) | | -25,847,594 | | | | | -25,847,594 |
| | | | | | | | |
| **2010 දෙසැම්බර් 31 දිනට ශේෂය** | | **-115,056,586** | **190,830,053** | **5,248,465** | **1,361,888,931** | **21,666,889** | **1,464,577,752** |

එස්. සිරිමාන්න මහතා
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

**දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය-කොළඹ විශ්වවිද්‍යාලය**
**2011 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | සටහන් | 2011 | | 2010 | |
|---|---|---|---|---|---|
| | | රුපි. | රුපි. | රුපි. | රුපි. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | | | | |
| සමාන්‍ය ක්‍රියාකාරකම් වලින් අතිරික්තය / (හිඟය) | | -25,847,594 | | -38,842,199 | |
| **මුදල්-නොවන වෙනස්වීම්** | | | | | |
| වෙනත් ගැළපීම් | **18** | 1,159,148 | | -62,408 | |
| ක්ෂය | | 26,639,718 | | 14,242,657 | |
| ක්‍රමක්ෂය | | -24,455,028 | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 25,217,653 | | 11,859,011 | |
| **ක්‍රියාකාරි ප්‍රාග්ධනයෙහි වැඩිවීම/අඩුවීම** | | | | | |
| ලැබිය යුතු දේ හි වැඩිවීම | **19** | -639,583 | | 6,109,928 | |
| විලම්බිත ආදායම් හි වැඩිවීම | | 1,924,981 | | | |
| ගෙවිය යුතු දේ හි වැඩිවීම | **20** | 1,657,831 | | 302,794 | |
| උපචිත වියදම් හි අඩුවීම | | -660,372 | | 734,351 | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | | 4,996,754 | | -5,655,866 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | | | | |
| පිරියත සහ උපකරණ මිලදී ගැනීම | | -20,775,610 | | -5,243,136 | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය** | | | -20,775,610 | | -5,243,136 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | | | | |
| ප්‍රාග්ධන ප්‍රධාන | | 20,350,000 | | 9,800,000 | |
| ඇවිරූ අරමුදල් හි වැඩිවීම | | -1,112,698 | | 174,140 | |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | | | 19,237,302 | | 9,974,140 |
| මුදල් සහ මුදල් සමාන දේ හි ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | | 3,458,446 | | -924,862 |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දේ | | | 6,613,608 | | 7,538,470 |
| කාලපරිච්ඡේදය ආවසානයේදී මුදල් සහ මුදල් සමාන දේ | **05** | | 10,072,054 | | 6,613,608 |

එස්. සිරිමාන්න මහතා
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

## දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය-කොළඹ විශ්වවිද්‍යාලය
## 2011.12.31 වන දිනට ශේෂ පිරික්සුම

| | විස්තරය | හර රුපි. | බැර රුපි. |
|---|---|---|---|
| 111001 | ප්‍රාග්ධනය | | 190,830,053.17 |
| 111002 | වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | | 5,248,465.23 |
| 113001 | විශේෂ ප්‍රදාන | | 0.00 |
| 113002 | DAFP/2006/07 ආචාර්ය. එදිරිවීර | | 64,267.10 |
| 113004 | විශේෂ අරමුදල - ආචාර්ය. අනෝමා ජයසිරි | | 300.00 |
| 113005 | DAFP/2010/12- ආචාර්ය. අනෝමා සමරවික්‍රම | | 50,000.00 |
| 113006 | DAFP/2010/03-ආචාර්ය. ජීවනි | | 59,833.00 |
| 122001 | සමාන්‍ය සංචිත | 89,208,988.00 | |
| 132002 | විශේෂ අරමුදල-බයිසාජ්ජා | | 857,355.01 |
| 132003 | විශේෂ අරමුදල-බයිසාජ්ජා (201) | | 753,320.50 |
| 133101 | පැවරුම් අරමුදල- ආචාර්ය. ලක්ෂ්මන් ද සිල්වා | | 105,635.62 |
| 134002 | ත්‍යාග සහ පරිත්‍යාග | | 21,040,181.96 |
| 134003 | ශිෂ්‍යත්ව එදිරිසිංහ | | 0.00 |
| 1333 | අධ්‍යක්ෂකගේ අරමුදල | | 274,180.00 |
| 1334 | අංශ සංවර්ධන අරමුදල - ද්‍රව්‍යගුණ | | 137,310.00 |
| 16101001 | ටෙන්ඩර් තැන්පතු | | 22,200.00 |
| 16101002 | ඇප තැන්පතු (සේවායෝජක) | | 5,000.00 |
| 16101003 | නේවාසිකාගාර තැන්පතු | | 204,172.30 |
| 16101004 | ශිෂ්‍යාධාර නොගෙවීම් | | 183,500.00 |
| 16101005 | මහපොල නොගෙවීම් | | 6,250.00 |
| 16101006 | වෙනත් තැන්පතු (ඉන්ධන තැන්පතු) | 75,000.00 | |
| 16101007 | මිල කැඳවීම් බැඳුම්කර | | 86,000.00 |
| 16101008 | ආරක්ෂණ තැන්පතු | | 327,382.79 |
| 16101009 | පර්යේෂණ වියදම් | | 0.00 |
| 16101010 | පුස්තකාල පොත්පත් වෙනුවෙන් තැන්පතු | | 59,460.00 |
| 16101011 | අවන්හල වෙනුවෙන් තැන්පතු | | 31,150.00 |
| 16101013 | ක්ෂය වෙන්කිරීම් | | 73,975,288.16 |
| 16101015 | රක්ෂණ අග්‍රිමය | | 0.00 |
| 16101016 | අවලංගු චෙක්පත් | | 141,691.52 |
| 40640 | නොගෙවූ වැටුප් | | 40,640.00 |
| 16101019 | නොගෙවූ විභාග ගාස්තු | | 86,274.13 |
| 16101022 | නොගෙවූ සහතිකපත්‍ර ආදායම | | 290.00 |
| 161011020 | පාරිතෝෂික වෙන්කිරීම් | | 39,119,817.50 |
| 16102001 | විවිධ තැන්පතු | | 295,721.30 |
| 162007 | ගෙවිය යුතු වැටුප් | | 1,195.62 |
| 162010 | ගෙවිය යුතු U.P.F. ණය | 0.00 | |
| 163001 | විගණන ගාස්තු | 400,000.00 | |
| 163002 | උපචිත වියදම් | | 1,538,127.91 |
| 166001 | රඳවාගැනීම් | 200.72 | |
| 2101038 | ප්‍රාග්ධනය- ගොඩනැගිලි-103 | 276,400,000.08 | |
| 2101041 | වාහන ගිණුම | 5,885,000.00 | |
| 2101064 | ප්‍රාග්ධනය- ගොඩනැගිලි-101 | 80,309,549.60 | |
| 2102003 | ප්‍රාග්ධනය-කාර්යාල උපකරණ-102 | 0.00 | |
| 2102004 | නේවාසිකාගාර උපකරණ | 0.00 | |
| 2103002 | ප්‍රාග්ධනය-කාර්යාල, විද්‍යාගාර සහ ඉගැන්වීමේ උපකරණ-102 | 17,661,480.59 | |
| 2104001 | ප්‍රාග්ධනය-පොත්පත් සහ සඟරා | 17,642,680.26 | |
| 2103004 | ගෘහභාණ්ඩ | 26,271,911.47 | |
| 2102008 | ක්‍රීඩා උපකරණ | 29,580.00 | |
| 2108A | 3 වන ආයුර්වේද ප්‍රදර්ශණය | | 1,994,066.29 |
| 221 | පැවරුම් අරමුදල - සරත් ගාමිණී රණසිංහ | | 65,069.46 |
| 221001 | පැවරුම් අරමුදල - එදිරිසිංහ | | 10,048.86 |
| 221002 | පැවරුම් අරමුදල - කොන්තසිංහ | | 24,411.47 |
| 221004 | පැවරුම් අරමුදල - බානගල | | 10,050.00 |
| 225001 | රඳවාගත් මුදල් ප්‍රාග්ධනය | | 2,264,118.23 |
| 225002 | ස්ථාවර තැන්පතු | 0.00 | |
| 2301001 | ගබඩා අත්තිකාරම් ගිණුම | 1,655,563.67 | |
| 2302012 | අධි තැන්පතු | | 488.00 |
| 2302013 | පෙරදිග වෛද්‍ය අරමුදල | | 60,000.00 |
| 2303001 | ආපදා ණය | 16,965,622.01 | |
| 2303002 | සේවක ණය | 351,038.55 | |
| 2303003 | වාහන ණය | 1,836,180.22 | |

| | | | |
|---|---|---|---|
| 2303004 | පරිගණක ණය | 988,460.00 | |
| 2303005 | විශේෂ ආපදා ණය | 37,500.00 | |
| 2303009 | උත්සව අත්තිකාරම් | 216,248.67 | |
| 2303010 | වැටුප් අත්තිකාරම් | 178,000.00 | |
| 2303011 | විශේෂ අත්තිකාරම් | | 2,250.00 |
| 2304001 | මහපොල ශිෂ්‍යත්ව අත්තිකාරම් | 0.00 | |
| 2305 | රක්ෂණ අත්තිකාරම් | | 0.00 |
| 2305001 | විවිධ අත්තිකාරම් | 1,093,441.37 | |
| 2305003 | අළුත්වැඩිය අත්තිකාරම් | 133.00 | |
| 2305005 | සේවා අත්තිකාරම් | 0.00 | |
| 2305009 | ආරක්ෂණ තැන්පතු ඉතිරිකිරීම් | 5,000.00 | |
| 2305012 | පොත් අත්තිකාරම් | | 900.57 |
| 23081 | භාණ්ඩාගාර තැන්පතු | | 0.00 |
| 2310001 | ම.බැ- බොරැල්ල-078100192268358 | 2,695,047.06 | |
| 2310002 | ම.බැ- බොරැල්ල-07810012268390 | 5,248,465.23 | |
| 2310003 | ම.බැ- බොරැල්ල-07810012268432 | 1,238,728.47 | |
| 2310004 | ම.බැ- බොරැල්ල-078100172268458 | 889,814.29 | |
| 2312001 | කලින් ගෙවීම් | 179,400.50 | |
| 2313002 | සුළු මුදල්- සරප් | 0.00 | |
| 2314006A | ලැබිය යුතු දේ - මහපොල | 307,300.00 | |
| 2314007 | මුදල් හුවමාරු ගිණුම | | 0.00 |
| 270003 | W.H.O. වියදම් | 16,560.00 | |
| 301B | රජයේ ප්‍රදාන-පුනරාවර්තන | | 139,220,104.00 |
| 304 | ආයෝජන ආදායම් | | 2,005.18 |
| 30203 | මහපොල අරමුදලින් ලදReceived from Mahapola Fund | | 3,605,550.00 |
| 30204 | මහපොල UGC වලින් ලද | | 730,100.00 |
| 30205 | ලද ශිෂ්‍යාධාර UGC | | 4,612,950.00 |
| 30207 | පර්යේෂණ අරමුදල-ආචාර්ය. හපුආරච්චි | | 17,492.10 |
| 303 | ණය පොලී ආදායම් | | 895,142.21 |
| 306 | දේපළ පොලී | | 95,856.00 |
| 308C | විවිධ ආදායම් | | 173,222.80 |
| 310009 | උපාධි ප්‍රදානොත්සව ගාස්තු | | 4,800.00 |
| 310010 | විභාග ගාස්තු | | 10,435.00 |
| 310011 | නේවාසිකාගාර ගාස්තු | | 210,805.00 |
| 310012 | සහතිකපත්‍ර ආදායම් | | 5,791.00 |
| 310015 | ටෙන්ඩර් ගාස්තු | | 18,000.00 |
| 310016 | ලියාපදිංචි කිරීමේ ගාස්තු | | 364,660.00 |
| 313 | පශ්චාත් උපාධි ආදායම් | | 2,036,182.52 |
| 318 | පුස්තකාල දඩ | | 63,941.62 |
| 310018 | සහරා අලෙවිය | | 7,800.00 |
| 318B | පැරණි තොග විකිනීම් | | 107,705.00 |
| 318C | පැරණි පොත් විකිනීම් | | 1,555.00 |
| 16101023 | පශ්චාත් උපාධි වියදම් | 2,036,182.52 | |
| 319 | විලම්බිත ආදායම් -පශ්චාත් උපාධි වියදම් | | 493,255.16 |
| 319A | විලම්බිත ආදායම් - පශ්චාත් උපාධි වියදම් - නව | 256,742.29 | |
| 324/1 | ආයෝජන ගිණුම - එදිරිසිංහ | 23,049.26 | |
| 324/2 | ආයෝජන ගිණුම - කොන්තසිංහ | 10,100.00 | |
| 324/3 | ආයෝජන ගිණුම - නේවාසිකාගාර තැන්පතු | 25,000.00 | |
| 324S | ආයෝජන ගිණුම - සරත් ගාමිණී රණසිංහ | 65,069.06 | |
| 8029902 | ආයෝජන ගිණුම - ලක්ෂ්මන් ද සිල්වා | 100,000.00 | |
| 3281 | ලැබිය යුතු පොලී | 6,113.08 | |
| 4101041 | පුද්ගල වේතන-A | 430,439.46 | |
| 4101042 | පුද්ගල වේතන-NA | 12,338,802.12 | |
| 410102 | ගමන් වියදම් සහ යැපීම් | 321,483.21 | |
| 410103 | සැපයුම් | 2,221,206.66 | |
| 410104 | නඩත්තු | 1,105,579.76 | |
| 410105 | කොන්ත්‍රාත්තුමය සේවා | 11,929,394.05 | |
| 410106 | වෙනත් පුනරාවර්තන වියදම් | 1,111,538.37 | |
| 440110 | ශිෂ්‍යයන් වෙත මූල්‍ය සහාය | 8,712,800.00 | |
| 410202 | ගමන් වියදම් සහ යැපීම් | 1,450.00 | |
| 410203 | සැපයුම් | 281,951.46 | |
| 410204 | නඩත්තු | 6,496.00 | |
| 4102041 | පුද්ගල වේතන-A | 165,025.00 | |
| 4102042 | පුද්ගල වේතන-NA | 4,899,109.78 | |
| 410205 | ක්‍රොන්තාත්තුමය සේවා | 33,778.28 | |
| 410206 | වෙනත් පුනරාවර්තන වියදම් | 128,158.14 | |

| | | | |
|---|---|---|---|
| 410503 | සැපයුම් | 639,132.51 | |
| 410504 | නඩත්තු | 226,414.00 | |
| 4105041 | පුද්ගල වේතන-A | 18,106.00 | |
| 4105042 | පුද්ගල වේතන-NA | 4,485,162.89 | |
| 410505 | කොන්ත්‍රාත්තුමය සේවා | 25,600.00 | |
| 410506 | වෙනත් පුනරාවර්තන වියදම් | 20,280.00 | |
| 420902 | ගමන් වියදම් සහ යැපීම් | 1,047,883.97 | |
| 420903 | සැපයුම් | 1,580,116.53 | |
| 420904 | නඩත්තු | 192,283.16 | |
| 4209041 | පුද්ගල වේතන-A | 67,234,218.04 | |
| 4209042 | පුද්ගල වේතන-NA | 11,873,749.55 | |
| 420905 | කොන්ත්‍රාත්තුමය සේවා | 471,433.81 | |
| 420906 | වෙනත් පුනරාවර්තන වියදම් | 1,232,088.83 | |
| 430102 | ගමන් වියදම් සහ යැපීම් | 400.00 | |
| 430103 | සැපයුම් | 244,798.48 | |
| 430104 | නඩත්තු | 44,553.12 | |
| 4301041 | පුද්ගල වේතන-A | 1,526,209.16 | |
| 4301042 | පුද්ගල වේතන-NA | 5,326,306.85 | |
| 430105 | කොන්ත්‍රාත්තුමය සේවා | 38,433.13 | |
| 430106 | වෙනත් පුනරාවර්තන වියදම් | 36,381.00 | |
| 450312 | වෙනත් මෙහෙයුම් වියදම් | 30,258,273.75 | |
| 480103 | සැපයුම් | 40,036.56 | |
| 480104 | නඩත්තු | 23,554.00 | |
| 4801041 | පුද්ගල වේතන- A | 13,644.00 | |
| 4801042 | පුද්ගල වේතන- NA | 1,140,367.55 | |
| 480105 | කොන්ත්‍රාත්තුමය සේවා | 2,024,925.55 | |
| 49001 | ක්ෂය ගිණුම | 26,639,717.59 | |
| 16211 | බයිසප්ජා පෙර-ලැබීම් | | 210,000.00 |
| 163002/1 | ගෙවිය යුතු ගිණුම-පශ්චාත් උපාධි | | 80,000.00 |
| 163002/2 | පශ්චාත් උපාධි පෙර-ලැබීම් | | 861,991.00 |
| 2314006/2 | UGC න් ලැබිය යුතු ශිෂ්‍යාධාර | 813,800.00 | |
| 2314006/B | ලැබිය යුතු බයිසප්ජා ආදායම් | 315,000.00 | |
| 30208 | ලැබීම්-බයිසප්ජා | | 1,253,741.24 |
| 310/A | වෙනත් ආදායම් | | 74,800.00 |
| 319/A | බයිසප්ජා වියදම් | 1,253,741.24 | |
| 131003 | ප්‍රත්‍යාගණන සංචිතය | | 1,361,888,931.00 |
| 301c | රජයේ ප්‍රධාන - පුනරුත්තාපන | | 835,712.48 |
| 112002 | පුනරුත්තාපන සහ වැඩිදියුණු කිරීමේ වියදම් | 835,712.48 | |
| 2109001 | පිරියත සහ යන්ත්‍රෝපකරණ | 1,590,236.00 | |
| 2102007 | පරිගණක | 6,605,100.00 | |
| 2101004 | ඉඩම් | 1,120,500,000.00 | |
| 318/1 | ක්‍රමක්ෂය කිරීමේ ආදායම් | | 24,455,028.00 |
| | | **1,882,314,022.01** | **1,882,314,022.01** |

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය සඳහා සටහන්

| 2010 | සටහන - 01(උපලේඛනය A) | | | 2011 |
|---|---|---|---|---|
| | **දේපළ, පිරියත සහ උපකරණ** | **පිරිවැය** | **සමු.ක්ෂය** | **ශු.පො.අ.** |
| **රුපි.** | | රුපි. | රුපි. | රුපි. |
| | ඉඩම් | 1,120,500,000 | 0 | 1,120,500,000 |
| 63,595,127 | නව ගොඩනැගිල්ල (103) | 276,400,000 | 13,820,000 | 262,580,000 |
| 9,238,120 | ගෘහභාණ්ඩ සහ උපකරණ (102) | 17,661,481 | 3,313,943 | 14,347,538 |
| 2,801,891 | විද්‍යාගාර සහ ඉගැන්වීමේ උපකරණ (102) | 26,271,911 | 2,583,076 | 23,688,835 |
| 32,064,661 | ගොඩනැගිල්ල (101) | 80,309,550 | 37,244,231 | 43,065,319 |
| 1,046,170 | මෝටර් වාහන | 5,885,000 | 1,177,000 | 4,708,000 |
| | පිරියත යන්ත්‍රෝපකරණ | 1,590,236 | 61,797 | 1,528,439 |
| | පරිගණක | 6,605,100 | 928,103 | 5,676,997 |
| **108,745,969** | | **1,535,223,278** | **59,128,150** | **1,476,095,128** |

**සටහන - 02**

**ආයෝජන (දිගු.කා.)**

| | | | |
|---|---|---|---|
| **රුපි.** | | රුපි. | |
| | **සම්මාන** | | |
| 21,050 | එදිරිසිංහ | 23,049 | |
| 10,100 | කොන්තසිංහ ශිෂ්‍යත්ව | 10,100 | |
| 60,966 | සරත් රණසිංහ | 65,069 | |
| | ආචාර්ය ලක්ෂ්මන් ද සිල්වා | 100,000 | |
| | | | 198,218 |
| | **වෙනත්** | | |
| 25,000 | නේවාසිකාගාර තැන්පතු | 25,000 | |
| 5,000 | ආරක්ෂණ තැන්පතු (මුදල් අයකැමි) | 5,000 | 30,000 |
| **122,116** | | | **228,218** |

**සටහන - 03 (උපලේඛනය B)**

| | **වෙනත් වත්කම්** | | | |
|---|---|---|---|---|
| | | **පිරිවැය** | **සමු. ක්ෂය** | **ශු.පො.අ.** |
| **රුපි.** | | රුපි. | රුපි. | රුපි. |
| 2,955,781 | පුස්තකාල පොත්පත් සහ වාර සඟරා | 17,642,680 | 14,845,166 | 2,797,514 |
| 0 | ක්‍රීඩා භාණ්ඩ | 29,580 | 1,972 | 27,608 |
| **2,955,781** | | **17,672,260** | **14,847,138** | **2,825,122** |

**සටහන - 04**

**ලැබිය යුතු දේ**

| | | | |
|---|---|---|---|
| **රුපි.** | | | රුපි. |
| 22,985,767 | ණය සහ අත්තිකාරම් | **(උපලේඛනය C)** | 20,573,048 |
| 32,491 | විවිධ අත්තිකාරම් | **(උපලේඛනය D)** | 1,093,441 |
| -901 | පොත් අත්තිකාරම් | | |
| 201 | රඳවා ගැනීම් | | 200 |
| 75,000 | ඉන්ධන තැන්පතු | | 75,000 |
| 102,299 | පෙර ගෙවීම් | **(උපලේඛනය E)** | 179,400 |
| 300,000 | ශිෂ්‍යාධාර අත්තිකාරම් | | 0 |
| 129 | ලැබිය යුතු පොලී | | 6,113 |
| | අළුත්වැඩියා අත්තිකාරම් | | 133 |
| | ලැබිය යුතු දේ - මහපොළ | | 307,300 |
| | UGC යෙන් ලැබිය යුතු ශිෂ්‍යාධාර | | 813,800 |
| | ලැබිය යුතු දේ - බයිසජ්ජා ආදායම් | | 315,000 |
| **23,494,986** | | | **23,363,435** |

| 2010 | | | 2011 |
|---|---|---|---|

## සටහන් - 05

**බැංකුවේ ඇති මුදල්**

| 2010 | | 2011 |
|---|---|---|
| 57,140 | ගිණුම් අංක:-078100122268432 | 1,238,728 |
| 5,663,245 | ගිණුම් අංක:-0781001122268390 | 5,248,465 |
| 227,451 | ගිණුම් අංක:-078100192268358 | 2,695,047 |
| 665,772 | ගිණුම් අංක:-078100172268458 | 889,814 |
| **6,613,608** | | 10,072,054 |

## සටහන් - 06

**ගෙවිය යුතු දේ**

| රුපි. | | | රුපි. |
|---|---|---|---|
| 129,550 | ගෙවිය යුතු දේ - මහපොල ශිෂ්‍යත්ව | | 6,250 |
| 1,415,900 | ගෙවිය යුතු ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව | | 183,500 |
| 3,355,173 | තැන්පතු | **(උපලේඛනය F)** | 945,086 |
| | නොගෙවූ වැටුප් | | 41,836 |
| 365,521 | ණයහිමියන් - අවලංගු චෙක්පත් | **(උපලේඛනය G)** | 141,692 |
| 1,550 | ගෙවිය යුතු දේ - ගමන් වියදම් | | 0 |
| 14,098 | රක්ෂණ අග්‍රිමය | | 0 |
| 10,441 | රක්ෂණ අත්තිකාරම් | | 0 |
| 127,296 | ගෙවිය යුතු දේ - විභාග ගාස්තු | **(උපලේඛනයH)** | 86,274 |
| 0 | අළුත්වැඩියා අත්තිකාරම් | | 0 |
| 1,482 | පැවරීම් | | 0 |
| | DAFP ගිණුම | **(උපලේඛනය I )** | 174,100 |
| | මිල ඉල්ලුම් බැඳුම්කර | | 86,000 |
| | නොගෙවූ සහතික පත්‍ර ආදායම | | 290 |
| | 3 වන ආයුර්වේද ප්‍රදර්ශණය | | 1,994,066 |
| | රඳවා ගැනීම් - ප්‍රාග්ධනය | **(උපලේඛනය J )** | 2,264,118 |
| | අධි තැන්පතු | | 488 |
| | විශේෂ අත්තිකාරම් | | 2,250 |
| | පොත් අත්තිකාරම් | | 901 |
| | බයිසජ්ජා වලින් පෙර-ලැබීම් | | 210,000 |
| | ගෙවිය යුතු ගිණුම් - පශ්චාත් උපාධි | | 80,000 |
| | පශ්චාත් උපාධි වලින් පෙර - ලැබීම් | | 861,991 |
| **5,421,011** | | | **7,078,842** |

## සටහන් - 07

**විලම්බිත ආදායම්**

| | | |
|---|---|---|
| 0 | විශේෂ අරමුදල - ආචාර්ය. අනෝමා ජයසිරි | 300 |
| 0 | විශේෂ අරමුදල-බයිසාජ්ජා | 857,355 |
| 0 | විශේෂ අරමුදල-බයිසාජ්ජා (201) | 753,321 |
| 0 | පෙරදිග වෛද්‍ය අරමුදල | 60,000 |
| 0 | පර්යේෂණ අරමුදල-ආචාර්ය. හපුආරච්චි | 17,492 |
| 0 | විලම්බිත ආදායම් -පශ්චාත් උපාධි වියදම් | 493,255 |
| 0 | විලම්බිත ආදායම් - පශ්චාත් උපාධි වියදම් - නව | -256,742 |
| 0 | | **1,924,981** |

| 2010 | සටහන් - 08 | 2011 |
|---|---|---|
| | **උපචිත වියදම්** | |
| රුපි. | වැය ශීර්ෂය | රුපි. |
| 3,740 | 1010501 | |
| 26,880 | 1010601 | |
| 57,599 | 1010602 | |
| 400 | 1010604 | |
| 0 | 1010607 | |
| 1,850 | 1010801 | |
| 362,621 | 1010802 | |
| 342,481 | 1010805 | |
| 113,169 | 1010806 | |
| 138,695 | 1010807 | |
| 900 | 1010808 | |
| 115,644 | 1010811 | |
| 9,230 | 1010908 | |
| 732 | 1010909 | |
| 4,739 | 1010914 | |
| 4,980 | 1010915 | |
| 22,000 | 1010920 | |
| 448 | 2090501 | |
| 48 | 2090504 | |
| 380 | 2090603 | |
| 0 | 2090606 | |
| 4,998 | 2090607 | |
| 850 | 2090811 | |
| 96,535 | 2090904 | |
| 33,000 | 2090906 | |
| 0 | 2090914 | |
| 72,890 | 2090916 | |
| 525 | 3010603 | |
| 0 | 8010607 | |
| 128,606 | 8010804 | |
| 34,220 | 8010806 | |
| 0 | 10104201 | |
| 19,381 | 10104208 | |
| 0 | 10204201 | |
| 4,453 | 10204208 | |
| 0 | 10204215 | |
| 296,506 | 10504208 | |
| 0 | 10504215 | |
| 0 | 20904111 | |
| 0 | 20904208 | |
| 0 | 30104208 | |
| 300,000 | විගණන ගාස්තු | |
| **2,198,500** | | **1,538,128** |

## සටහන් - 09

**ප්‍රාග්ධන ප්‍රදාන**

| රුපි. | | රුපි. |
|---|---|---|
| 236,944,536 | වැයකළ ප්‍රාග්ධන ප්‍රදාන ආරම්භක ශේෂය | 242,689,849 |
| 5,745,313 | වැයකළ ප්‍රාග්ධන ප්‍රදාන | 19,930,803 |
| | 2010 වර්ෂය දක්වා ක්‍රමක්ෂය | -47,335,571 |
| | 2011 වර්ෂය සඳහා ක්‍රමක්ෂය | -24,455,028 |
| **242,689,849** | | **190,830,053** |

| 2010 | සටහන් - 10 | | 2011 |
|---|---|---|---|
| **රුපි.** | <u>**පොදු සංචිත**</u> | | රුපි. |
| **-99,595,704** | ආරම්භක ශේෂය | | -138,487,746 |
| **0** | ක්‍රමක්ෂය | | 47,335,571 |
| **-49,843** | වෙනත් ගැළපුම් | | 1,943,183 |
| **-38,842,199** | ආදායම ඉක්මවා වියදම් අතිරික්තය | | -25,847,594 |
| **-138,487,746** | | | -115,056,586 |

| | | | |
|---|---|---|---|
| | සටහන් - 11 | | |
| | සමුච්චිත අරමුදල | | |
| | අධ්‍යක්ෂක අරමුදල | | 274,180 |
| **103,170** | පැවරුම් අරමුදල | **(උපලේඛනයK)** | 215,217 |
| | පරයේෂණ සහ සංවර්ධන අරමුදල (UGC) | | 0 |
| **871,215** | ආයුර්වේද රෝහලෙන් විශේෂ අරමුදල | | |
| **9,690,661** | ත්‍යාග සහ පරිත්‍යාග | **(උපලේඛනයL)** | 21,040,182 |
| **664,820** | පර්යේෂණ අරමුදල (ලෝ.ස.ස) | | 0 |
| 100,000 | වෙනත් අරමුදලි-ආචාර්ය. ලක්ෂ්මන් ද සිල්වා | | 0 |
| | අංශ සංවර්ධන අරමුදල - ද්‍රව්‍යගුණ | | 137,310 |
| | ප්‍රත්‍යාගණන සංචිතය | | 1,361,888,931 |
| **11,429,866** | | | **1,383,555,820** |

## මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය සඳහා සටහන්

### සටහන් - 12

| 2010 | | 2011 |
|---|---|---|
| රුපි. | **වෙනත් ආදායම්** | රුපි. |
| 2,807 | ආයෝජන පොලී | 2,005 |
| 724,718 | ණය පොලී | 895,142 |
| 278,983 | දේපළ කුලී | 95,856 |
| 23,100 | ටෙන්ඩර් ගාස්තු | 18,000 |
| 0 | විවිධ ලැබීම් | |
| 363,354 | ලියාපදිංචි ගාස්තු (උපාධි අපේක්ෂකයන්) | 364,660 |
| 0 | ලියාපදිංචි ගාස්තු (පශ්චාත් උපාධි අපේක්ෂකයන්) | |
| 0 | ලියාපදිංචි ගාස්තු (සැපයුම්කරුවන්) | |
| 11,245 | විභාග ගාස්තු (උපාධි අපේක්ෂකයන්) | 10,435 |
| 5,550 | සහතිකපත්‍ර ආදායම | 5,791 |
| 80,016 | පුස්තකාල දඩ | 63,942 |
| 46,440 | පර්යේෂණ ආදායම් ලො.ස.ස | 0 |
| 184,755 | නේවාසිකාගාර ගාස්තු | 210,805 |
| 0 | කොන්තසිංහගෙන් පොලී | |
| 77,073 | විවිධ ආදායම් | 173,223 |
| | උපාධි ප්‍රදානෝත්සව ගාස්තු | 4,800 |
| | පශ්චාත් උපාධි ආදායම් | 2,036,183 |
| | ප්‍රකාශන විකිනීම් | 7,800 |
| | පැරණි තොග විකිනීම් | 107,705 |
| | පැරණි පොත් විකිනීම් | 1,555 |
| | ලැබීම් - බයිසජ්ජා | 1,253,741 |
| | වෙනත් ආදායම් | 74,800 |
| **1,798,041** | | **5,326,443** |

### සටහන් - 13

| | | | |
|---|---|---|---|
| රුපි. | | **සමාන්‍ය පරිපාලනය** | රුපි. |
| | 4101041 | පුද්ගල වේතන-A | 430,439.46 |
| 13,627,937 | 4101042 | පුද්ගල වේතන-NA | 12,338,802 |
| 45,915 | 410102 | ගමන් සහ යැපීම් | 321,483 |
| 2,527,414 | 410103 | සැපයුම් | 2,221,207 |
| 1,693,568 | 410104 | නඩත්තු | 1,105,580 |
| 12,093,973 | 410105 | කොන්ත්‍රාත්තුමය සේවා | 11,929,394 |
| 861,999 | 410106 | වෙනත් පුනරාවර්තන වියදම් | 1,111,538 |
| 8,687,950 | 440110 | ශිෂ්‍යයන් වෙත මූල්‍ය සහාය | 8,712,800 |
| | 4102041 | පුද්ගල වේතන-A | 165,025 |
| 3,920,569 | 4102042 | පුද්ගල වේතන-NA | 4,899,110 |
| | 410202 | ගමන් සහ යැපීම් | 1,450 |
| 195,905 | 410203 | සැපයුම් | 281,951 |
| 4,704 | 410204 | නඩත්තු | 6,496 |
| | 410205 | කොන්ත්‍රාත්තුමය සේවා | 33,778.28 |
| 30,587 | 410206 | වෙනත් පුනරාවර්තන වියදම් | 128,158 |
| | 4105041 | පුද්ගල වේතන-A | 18,106 |
| 5,013,803 | 4105042 | පුද්ගල වේතන-NA | 4,485,163 |
| 834,753 | 410503 | සැපයුම් | 639,133 |
| 14,200 | 410504 | නඩත්තු | 226,414 |
| | 410505 | කොන්ත්‍රාත්තුමය සේවා | 25,600 |
| 51,020 | 410506 | වෙනත් පුනරාවර්තන වියදම් | 20,280 |
| **49,604,297** | | | **49,101,908** |

**සටහන් - 14**

| 2010 | | | 2011 |
|---|---|---|---|
| රුපි. | | **අධ්‍යයන සේවා** | රුපි. |
| 45,373,849 | 4209041 | පුද්ගල වේතන-A | 67,234,218 |
| 14,555,959 | 4209042 | පුද්ගල වේතන-NA | 11,873,750 |
| 87,710 | 420902 | ගමන් සහ යැපීම් | 1,047,884 |
| 1,636,025 | 420903 | සැපයුම් | 1,580,117 |
| 55,207 | 420904 | නඩත්තු | 192,283 |
| 310,227 | 420905 | කොන්ත්‍රාත්තුමය සේවා | 471,434 |
| 3,239,664 | 420906 | වෙනත් පුනරාවර්තන වියදම් | 1,232,089 |
| 65,258,641 | | | 83,631,775 |

**සටහන් - 15**

| 2010 | | | 2011 |
|---|---|---|---|
| රුපි. | | **පුස්තකාල සේවා** | රුපි. |
| 1,116,845 | 4301041 | පුද්ගල වේතන-A | 1,526,209 |
| 5,114,530 | 401042 | පුද්ගල වේතන-NA | 5,326,307 |
| 175 | 430102 | ගමන් සහ යැපීම් | 400 |
| 266,483 | 430103 | සැපයුම් | 244,798 |
| 16,540 | 430104 | නඩත්තු | 44,553 |
| 3,663 | 430105 | කොන්ත්‍රාත්තුමය සේවා | 38,433 |
| 44,202 | 430106 | වෙනත් පුනරාවර්තන වියදම් | 36,381 |
| 6,562,438 | | | 7,217,081 |

**සටහන් - 16**

| රුපි. | | **නේවාසිකාගාර** | රුපි. |
|---|---|---|---|
| | 4801041 | පුද්ගල වේතන-A | 13,644 |
| 1,094,299 | 4801042 | පුද්ගල වේතන-NA | 1,140,368 |
| 343,956 | 480103 | සැපයුම් | 40,037 |
| 66,540 | 480104 | නඩත්තු | 23,554 |
| 2,571,145 | 480105 | කොන්ත්‍රාත්තුමය සේවා | 2,024,926 |
| 4,075,940 | | | 3,242,529 |

## ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සඳහා සටහන්

## සටහන් - 17

| 2010 | මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය තුළ | 2011 |
|---|---|---|
| රුපි. | .-හඳුනා නොගත් ශුද්ධ ආදායම් සහ පාඩු | රුපි. |
| -171 | සේවක ණය | 0 |
| -49,672 | උපචිත වියදම් | 0 |
| | | 120,071 |
| | | 402,777 |
| | | 98,503 |
| | | 48,393 |
| | | 103,241 |
| | | -177,252 |
| | | -300,000 |
| | | 1,478,400 |
| | | 169,050 |
| **-49,843** | | **1,943,183** |

## මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්

### සටහන් - 18

| 2010 | | 2011 |
|---|---|---|
| රු.පි. | **වෙනත් ගැළපුම්** | රු.පි. |
| -171 | සේවක ණය | |
| -49,672 | උපචිත වියදම් | |
| -1,515 | කොන්තසිංහගෙන් පොලිය | |
| -11,050 | එදිරිසිංහගෙන් පොලිය | -11,050 |
| | | -177,252 |
| | | -300,000 |
| | | 1,478,400 |
| | | 169,050 |
| -62,408 | | **1,159,148** |

### සටහන් - 19

| | | |
|---|---|---|
| රු.පි. | **ලැබිය යුතු දේ වල වැඩිවීම** | රු.පි. |
| 1,049,230 | තොග අත්තිකාරම් | -771,134 |
| 5,242,815 | ණය සහ අත්තිකාරම් | 2,412,719 |
| -29,297 | විවිධ අත්තිකාරම් | -1,060,950 |
| 19,266 | පොත් අත්තිකාරම් | -901 |
| 38 | රඳවා ගැනීම් | 1 |
| 128,005 | පෙර ගෙවුම් | -77,101 |
| -300,000 | ශිෂ්‍යාධාර අත්තිකාරම් | 300,000 |
| -129 | ලැබියු යුතු පොලිය | -5,984 |
| | අළුත්වැඩියා අත්තිකාරම් | -133 |
| | ලැබිය යුතු මහපොල | -307,300 |
| | UGC යෙන් ලැබිය යුතු ශිෂ්‍යාධාර | -813,800 |
| | ලැබිය යුතු බයිසජ්ජා ආදායම | -315,000 |
| **6,109,928** | | **-639,583** |

### සටහන් - 20

| | | |
|---|---|---|
| රු.පි. | **ගෙවිය යුතු දේ වල වැඩිවීම** | රු.පි. |
| -850 | විලම්බිත මහපොල ශිෂ්‍යත්ව | -123,300 |
| 287,200 | විලම්බිත ශිෂ්‍යාධාර ශිෂ්‍යත්ව | -1,232,400 |
| -66,919 | තැන්පතු | -2,410,087 |
| -19,057 | නොගෙවූ වේතන | 41,836 |
| 53,289 | ණයහිමියන් - ඉදිරිපත් නොකළ චෙක්පත් | -223,829 |
| 62,773 | ගෙවිය යුතු විභාග ගාස්තු | -41,022 |
| -13,642 | අළුත්වැඩියා අත්තිකාරම් | 0 |
| | පැවරුම් | -1,482 |
| | ගෙවිය යුතු ගමන් වියදම් | -1,550 |
| | රක්ෂණ අග්‍රිමය | -14,098 |
| | රක්ෂණ අත්තිකාරම් | -10,441 |
| | DAFP ගිණුම | 174,100 |
| | මිල කැඳවීම් බැඳුම්කර | 86,000 |
| | නොගෙවූ සහතිකපත්‍ර ආදායම | 290 |
| | ආයුර්වේද ප්‍රදර්ශණය | 1,994,066 |
| | රඳවා ගැනීම් - ප්‍රාග්ධනය | 2,264,118 |
| | අධි තැන්පතු | 488 |
| | විශේෂ අත්තිකාරම් | 2,250 |
| | පොත් අත්තිකාරම් | 901 |
| | බයිසජ්ජා වලින් පෙර - ලැබීම් | 210,000 |
| | පශ්චාත් උපාධි ගෙවිය යුතු ගිණුම | 80,000 |
| | පශ්චාත් උපාධි වලින් පෙර - ලැබීම් | 861,991 |
| 302,794 | | 1,657,831 |

උපලේඛනය-A

**2011 වර්ෂය සඳහා ස්ථාවර වත්කම් සහ ක්ෂය අනුපාතය**
**(ගොඩනැගිලි, ගෘහභාණ්ඩ සහ කාර්යාල උපකරණ, විද්‍යාගාර සහ ඉගැන්වීමේ සහ පුස්තකාල පොත් )**

රුපි.

| විස්තරය/ අයිතම | ක්ෂය අනුපාතය | 2010.12.31 ට ශේෂය | 2011 වර්ෂය සඳහා අපහරණය කිරීම් | 2011 වර්ෂය සඳහා එක් කිරීම් | 2011.12.31 ට ශේෂය | 2010.12.31 දක්වා ක්ෂය | 2011 වර්ෂය සඳහා ක්ෂය | සමුච්චිත ක්ෂය | ශු.පො.අ. |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | _ | 1,120,500,000 | 0 | 0 | 1,120,500,000 | 0 | 0 | 0 | 1,120,500,000 |
| නව ගොඩනැගිල්ල - 103 | 5% | 276,400,000 | 0 | 0 | 276,400,000 | 0 | 13,820,000 | 13,820,000 | 262,580,000 |
| කාර්යාල, විද්‍යාගාර සහ ඉගැන්වීමේ උපකරණ | 20% | 7,283,805 | 0 | 10,377,676 | 17,661,481 | 0 | 3,313,943 | 3,313,943 | 14,347,538 |
| ගෘහභාණ්ඩ සහ සවිකිරීම් | 10% | 24,867,934 | 0 | 1,403,977 | 26,271,911 | 0 | 2,583,076 | 2,583,076 | 23,688,835 |
| ගොඩනැගිල්ල- 101 | 5% | 65,734,796 | 0 | 14,574,754 | 80,309,550 | 33,670,136 | 3,574,095 | 37,244,231 | 43,065,319 |
| මෝටර් වාහන | 20% | 5,885,000 | 0 | 0 | 5,885,000 | 0 | 1,177,000 | 1,177,000 | 4,708,000 |
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | 20% | 192,500 | | 1,397,736 | 1,590,236 | 0 | 61,797 | 61,797 | 1,528,439 |
| පරිගණක | 20% | 3,441,000 | | 3,164,100 | 6,605,100 | 0 | 928,103 | 928,103 | 5,676,997 |
| එකතුව | | **1,504,305,035** | **0** | **30,918,243** | **1,535,223,278** | **33,670,136** | **25,458,014** | **59,128,150** | **1,476,095,128** |

<u>උපලේඛනය -B</u>

| විස්තරය/ අයිතම | ක්ෂය අනුපාතය | **2010.12.31** ට ශේෂය | 2011 වර්ෂය ඇතුළත අපහරණය කිරීම් | **2011** වර්ෂය මිලදී ගැනිම් | **2011.12.31** දිනට ශේෂය | **2010.12.31** දක්වා ක්ෂය | **2011** වර්ෂය ක්ෂය | සමුච්චිත ක්ෂය | ශු.පො.අ. |
|---|---|---|---|---|---|---|---|---|---|
| පුස්තකාල පොත් සහ වාර සඟරා | 20% | 16,621,213 | 0 | 1,021,467 | 17,642,680 | 13,665,433 | 1,179,733 | 14,845,166 | 2,797,514 |
| ක්‍රීඩා උපකරණ | 20% | 0 | | 29,580 | 29,580 | 0 | 1,972 | 1,972 | 27,608 |
| | | **16,621,213** | **0** | **1,051,047** | **17,672,260** | **13,665,433** | **1,181,705** | **14,847,138** | **2,825,122** |

2011.12.31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය ප්‍රකාශන වලට සටහන්

1. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 පොදු ප්‍රතිපත්ති

1.1.1 වාර්තාකරණ ආයතනය

කොළඹ **විශ්වවිද්‍යාලයීය** දේශීය **වෛද්‍ය විද්‍යායතනය** 1980.01.01 දින 1978 අංක 16 දරණ විශ්ව **විද්‍යාල** පනත සහ අංක 67/14 දරණ ආඥා පනත යටතේ සංස්ථාගත කරන ලදී.

වත්කම්, වගකීම්, ශුද්ධ වත්කම්, ආදායම්, වියදම් සහ සියලුම මෙහෙයුම් වල අනෙකුත් ගණුදෙනු ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වලින් පිලිබිඹු කරයි.

1985 අංක 7 දරණ **විශ්වවිද්‍යාල** (සංශෝධන) පනත සහ 1971 අංක 38 දරණ මූල්‍ය පනත ඇතුළු තදනන්තර ව්‍යවස්ථා සම්පාදනයන් මගින් සංශෝධිත පරිදි **විශ්වවිද්‍යාල** පනතේ වගන්ති 106(1), (2) සහ 107(b) ප්‍රකාරව එයට අනුකූලව මූල්‍ය පරිපාලනය විසින් මෙම සංශෝධිත ප්‍රකාශන පිළියෙල කර ඇත.

1.1.2 ප්‍රධාන කටයුතු සහ මෙහෙයුම්වල ස්වභාවය

උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි මට්ටම් වලදී ආයුර්වේද, යුනානි සහ දේශීය **වෛද්‍ය** ක්‍රමය පිළිබඳ උපදෙස් සපයනු ලබන ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම උසස් අධ්‍යාපන ආයතනය IIM (දේශීය **වෛද්‍ය විද්‍යායතනය**) වේ.

මූලික සෞඛ්‍ය රැකවරණය, පොදු සෞඛ්‍ය රැකවරණ ගැටළු, සෞඛ්‍ය ප්‍රවර්ධන සහ රෝග වැළැක්වීමේ අභියෝගාත්මක අවශ්‍යතා වලට සරිලන ලෙස IIM විසින් **වෛද්‍ය** වෘත්තිකයන් බිහි කරයි.

ආයතනය ප්‍රධානවම රජයේ ප්‍රදාන මත ක්‍රියා කරයි.

1.1.3 පිළියෙල කිරීමේ පදනම

(i) අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශන තුළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, ශුද්ධ වත්කම්වල වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන වලට සටහන් අඩංගු වේ. මෙම ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLAS) අනුකූලව පිළියෙල කොට ඇත.

**(ii)** මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම පිළියෙල කර ඇති අතර සඳහන් කර ඇත්නම් මිස මුදල් අගයේ වෙනස්වීම් සැලකිල්ලට ගෙන නැත. වත්කම් හුවමාරුවේදී දෙන ලද ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත පිරිවැය පදනම් වේ.

(iii) ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

ආයතනයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර ඇත.

1.2 වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම

1.2.1 දේපළ, පිරියත සහ උපකරණ

ආයතනයේ කාර්යාල විද්‍යාගාරය, ඉගැන්වීම් උපකරණ, ගොඩනැගිලි, ලීබඩු සහ සවිකිරීම් සහ වාහන ප්‍රත්‍යාගණනය කොට 2011.01.01 දින සිට ගිණුම් වලට හඳුන්වා දී ඇත. 2011.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ ප්‍රත්‍යාගණිත ඉඩම් අගය සැලකිල්ලට ගෙන ඇත. වසර තුළ මිලට ගත් දේපළ, පිරියත සහ උපකරණ සහ පුස්තකාල පොත් පිරිවැය මත පෙන්වා ඇත.

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ප්‍රත්‍යාගණිත අංගය සහ වත්මන් වසරේ මිලදී ගැනීම් පිරිවැය මත ක්ෂය ගණනය කර ඇත. වසරකට පහත අනුපාත භාවිතා කරන ලදී.

| | |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ලීබඩු සහ සවි කිරීම් | 10% |
| කාර්යාල විද්‍යාගාරය සහ ඉගැන්වීම් උපකරණ | 20% |
| පරිගණක | 20% |
| මෝටර් වාහන | 20% |
| පුස්තකාල පොත් | 20% |

2010 වසරේ ප්‍රත්‍යාගණනය සහ පරිත්‍යාග හේතුවෙන් ජංගම නොවන වත්කම් මිලියන 1367.5 ක් වැඩි වී ඇත.




2011 වසර සඳහා ක්ෂය රු. මිලියන 26.6 ක් වෙන් කර ඇත. එය රු. මිලියන 12.4 කින් වැඩි කර ඇත. ප්‍රත්‍යාගණනය හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය රු. මිලියන 73.9 කි.

වසර 2010 ට වඩා තොග අගය වැඩි කර ඇති බව සටහන් කර ගැනේ. එනම් රු. මිලියන 0.7 කි.

ලැබිය යුතු දේ රු. මිලියන 0.8 කින් අඩු වී තිබිණි.




1.2.2 බඩු තොග

බඩු තොග පිරිවැයට ගණනය කර ඇත.

1.2.3 ලැබිය යුතු දේ

ඒවා නිශ්කාශනයට ඇස්තමේන්තුගත කළ අගයන්ට ලැබිය යුතු දේ සටහන් කර ඇත.

1.2.4 කෙටිකාලීන ආයෝජන

ඇතැම් ආයෝජන එහි පොලී සමගින් අලුත් කොට ඇත.

1.3 වගකීම් සහ වෙන්කිරීම්

දන්නා සියලු වගකිම් 2011.12.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති අතර පවත්නා බව දන්නා නමුත් අගය නිවැරදිව නිශ්චය කළ නොහැකි වගකීම් වලට ප්‍රමාණවත් වෙන්කිරීම් සිදු කර ඇත.

ඉල්ලීම මත ගෙවීමට බැඳී සිටින හෝ වසරක් තුළ ගෙවිය යුතු දේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි ජංගම වගකිම් ලෙස සලකා ඇත. වසරකට පසු ගෙවිය යුතු වගකීම මූල්‍ය තත්ත්වයෙහි දී ඇති ජංගම නොවන වගකිම් ලෙස සලකා ඇත.

1.3.1 ප්‍රදාන සඳහා ගිණුම්කරණය

දරන ලද වියදම් ප්‍රතිපූරණය කරන ප්‍රදාන, වියදම් දරන ලද කාල පරිච්ඡේදයෙහි තුළම මූල්‍ය කාර්යසාධන වාර්තාවේ ආදායම් ලෙස සටහන් වේ. වත්කමක පිරිවැය ප්‍රතිපූරණය කරන ප්‍රදාන අදාළ වත්කමේ උපයෝගී කාලය තුළ ක්‍රමික පදනම මත මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ සටහන් කෙරේ.

1.3.2 සේවක ප්‍රතිලාභ

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ අවශ්‍ය වන ලෙස සියලු සුදුසුකම් ඇති සේවකයන් සඳහා ප්‍රතිලාභ සැලසුම යොදාගෙන ඇත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්, වයස, සේවා කාලය සහ හානිපූරණය යනාදී සාධක මත සාමාන්‍යයෙන් රඳා පවතිමින් සේවකයෙකු වෙත විශ්‍රාම යන විට ලැබෙන ප්‍රතිලාභයේ අගය නිශ්චය කරයි.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වලට අදාළව මූල්‍ය තත්ත්වයෙහි සටහන් වගකීම, 2012.12.31 දිනට බැඳී සිටීම් වල වර්තමාන අගය වේ.

1.4 අදායම හඳුනාගැනීම

ආයතනය වෙත ආර්ථික ප්‍රතිලාභ ප්‍රවාහ වනු ඇති හැකියාවේ තරමට ආදායමට සටහන් කරයි.

පහත දක්වා ඇති පරිදි පුනරාවර්තන, ශිෂ්‍යාධාර, මහපොළ අභ්‍යන්තර ආදායම සඳහා රජයේ ප්‍රදාන 2011 වසර සඳහා රු. මිලියන 168.8 කි.

| | 2011 | 2010 |
|---|---|---|
| පුනරාවර්තන වෙනුවෙන් රජයේ ප්‍රදාන | Rs.168.8 M | Rs.114.3 M |




1.1 වියදම්

දරන ලද පිරිවැය සහ ආදායමේ විශේෂිත අයිතම අතර සෘජු සම්බන්ධතාවයේ පදනම මත මූල්‍ය කාර්යසාධනය තුළ වියදම් සටහන් කෙරේ. ආයතනය මෙහෙයවීමේදී සහ ප්‍රාග්ධන වත්කම් පවත්වාගෙන යාමේදී දරන ලද සියලු වියදම් වසර සඳහා අතිරික්තය / ඌනතාවය වෙත එළඹීමේදී ආදායම් ගිණුමෙන් අය කරගෙන ඇත.

1.2 සංසන්දනාත්මක තොරතුරු

හැකි සෑම විටම සෑම ප්‍රකාශනයකම සංසන්දනාත්මක අගයන් දක්වා ඇත.

නියෝජ්‍ය මූල්‍යාධිකාරී /IIM

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No: ඊයි/ඒ/අයිඅයිඑම්/එෆ්ඒ/11 — ඔබේ අංකය / உமது இல / Your No. — දිනය / திகதி / Date: 2012 නොවැම්බර් 01 දින.

අධ්‍යක්ෂ,
දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය,
කොළඹ විශ්වවිද්‍යාලය.

**කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යායතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය සහ 111 වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ වෙත 2012 අප්‍රේල් 30 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දූව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයනගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවීහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳව ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 අහිතකර විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 අහිතකර විගණන මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

මූල්‍ය ප්‍රකාශනයන්හි ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණිත අගයන් මත ගිණුම් නොගැලපීම, ස්ථාවර වත්කම් ක්ෂය ක්‍රමක්ෂය කිරීමේ ගැටළු සහගත බව, ආදායම් ගිණුම් තැබීමේ දෝෂ ඇතුළුව පැවති ප්‍රමාණාත්මක දෝෂ හේතුවෙන් ඉවත්කරගන්නා ලද මූල්‍ය ප්‍රකාශන සංශෝධනය කර 2012 සැප්තැම්බර් 03 දින නැවත භාරදී තිබූ අතර සංශෝධිත විගණකාධිපති වාර්තාවේ කෙටුම්පත 2012 සැප්තැම්බර් 21 දින ආයතනයේ අධ්‍යක්ෂ වෙත ලබාදෙන ලදී.

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භය දක්වා ආයතනය විසින් රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් තැබීමේදී අනුගමනය කළ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 පරිදි වූ "ප්‍රාග්ධන පදනම" එම ප්‍රමිතියෙහි වූ "අයභාර පදනම " ලෙස කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියකින් තොරව වෙනස් කර තිබූ අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 10 ට අනුව එමගින් මූල්‍ය ප්‍රකාශනවලට සිදුවූ බලපෑම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි.

එසේම ගිණුම්වල පැවති පහත සඳහන් අඩුපාඩු නිරාකරණය කර ගැනීමකින් තොරව මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කර තිබුණි.

(i) 2011 ජනවාරි 01 දිනට ශුද්ධ අගය රු.76,681,308 ක් වූ ස්ථාවර වත්කම් වර්ග 05 ක් ඉදිරි ඵලදායී ජීවිත කාලය සැලකිල්ලට නොගෙන රු.318,070,239 කට ප්‍රත්‍යාගණනය කිරීම නිසා කෙටි ජීවිත කාලයක් සහිත වත්කම් හඳුනා ගත නොහැකිව සියළුම ස්ථාවර වත්කම් එකම ක්ෂය අනුපාතයක් මත සම්පූර්ණ ඵලදායී ජීවිත කාලයක් සහිත වත්කම් ලෙස සලකා ක්ෂය ගණනය සිදු කර තිබීම.

(ii) ප්‍රත්‍යාගණිත ස්ථාවර වත්කම් ගිණුම් තුළ පැවති ත්‍යාග හා ප්‍රදාන හඳුනා නොගැනීම.

(iii) 2011 දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් "ක්ෂය" ක්‍රමක්ෂය කිරීමේදී රජයේ ප්‍රාග්ධන ප්‍රදාන, ත්‍යාග හා ප්‍රදාන සහ ප්‍රත්‍යාගණන සංචිතය යන ගිණුම් තුනටම ගැලපිය යුතු වුවත් රු. 24,455,029 ක් වූ සම්පූර්ණ ක්‍රමක්ෂය වටිනාකම රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට පමණක් ගලපා තිබීම.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 29 අනුව සාධාරණ පදනමකට ගිණුම් කාලපරිච්ඡේද අතර පැහැදිලිව බෙදා වෙන් කළ හැකිව තිබූ, 2011 වර්ෂයේ අවසන් වූ පාඨමාලා දෙකක් සහ 2011 ජූලි - 2013 ජූලි අතර කාලය තුළ පැවැත්වෙන පාඨමාලාවක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 4,027,225 ක් වුවද, එම පාඨමාලාවන්හි වියදම වූ රු.2,339,174 කට සමාන ප්‍රමාණයක් පමණක් ආදායම ලෙස ගිණුම්ගත කර ශේෂය ඉදිරියට ලැබූ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) පෙර වර්ෂයන්හි පිරිවැය හෝ ක්ෂය ගැලපීම්වල සිදු වී තිබූ වැරදි හේතුවෙන් ඵලදායී ජීවිත කාලය අවසන් නොවූ වාහනවල ශුද්ධ අගය ශුන්‍ය ලෙසට දැක්වීමේ වරද නිවැරදි කිරීමකින් තොරව ප්‍රත්‍යාගණන අගයන් ගැලපීම හේතුවෙන් රු. 4,838,830 ක් ලෙස ගණනය කළ වාහන ප්‍රත්‍යාගණන ලාභය නිවැරදි නොවන බවට නිරීක්ෂණය විය

(ආ) (i) 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 99 වගන්තිය අනුව සියලු ලැබීම් ආයතනයේ අරමුදලට බැර කළ යුතු වුවද, ඉන් බැහැරව, ආයතනයේ ආදායමට බැර විය යුතු රු.451,490 ක් යොදා අධ්‍යක්ෂ අරමුදල හා අංශ සංවර්ධන අරමුදල නමින් අරමුදල් 02 ක් ඇතිකර තිබුණි.

(ii) පාඨමාලාවේ සිසුන් 14 දෙනෙක් සඳහා 2012 වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.455,000 ක් රු. 210,000 ක් වශයෙන් ඉදිරියට ලැබීම් සටහන් කිරීමෙන් රු. 245,000 සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩියෙන් ද 2011 දෙසැම්බර් 31 දිනට සිසුන් 09 දෙනෙකුගෙන් ලැබිය යුතු රු. 157,500 ක පාඨමාලා ගාස්තු රු.315,000 ක් වශයෙන් සටහන් කිරීමෙන් තවත් රු.157,500 කින් ආදායම වැඩියෙන් සටහන් කර තිබුණි.

(ඇ) (i) පශ්චාත් උපාධි නව පාඨමාලාව සඳහා ශිෂ්‍යයෙකු විසින් 2010 නොවැම්බර් 24 දින ගෙවූ නමුත් ඉදිරියට ලැබීම් ලෙස එම අවස්ථාවේ ගිණුම්ගත නොකළ රු. 23,750 ක් සමාලෝචිත වර්ෂයේදී නිවැරදිව ගිණුම් නොගැලපීම සහ 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පාඨමාලා ගාස්තු රු. 44,000 ක් ගිණුම්ගත නොකිරීමත් හේතුවෙන් රු. 67,750 කින් ඉදිරියට ලැබූ ආදායම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ii) පශ්චාත් උපාධි පාඨමාලාවේ සමාලෝචිත වර්ෂයට අදාල වියදම රු. 1,207,491 ක් වුවද, එය රු. 950,749 ක් ලෙස රු.256,742 ක් අඩුවෙන් ද එම පාඨමාලාව සඳහා ලියාපදිංචි වී වෙනත් පාඨමාලාවකට මාරු වූ ශිෂ්‍යයකු විසින් 2012 වර්ෂයේදී ගෙවූ රු.20,800 ක මුදල සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු ආදායම් ලෙස ද ගිණුම්ගත කර තිබුණි.

(ඇ) (i) 2005 ජනවාරි 31 දිනැති අංක 856 දරන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව ගෙවූ ශිෂ්‍යාධාර පමණක් ප්‍රතිපූර්ණය කර ගැනීමට ඉල්ලුම් කළ යුතු වුවත්, ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව මත ප්‍රතිපූර්ණය කිරීම හේතුවෙන් ඉතිරි වූ රු.159,800 ක් ශිෂ්‍යාධාර තැන්පතු (නොගෙවූ) ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ii) ආදායම් හා වියදම් ගිණුමෙහි සමාලෝචිත වර්ෂයේ මහපොළ ලැබීම් (ආදායම්) රු. 8,948,600 ක් ද එම ගෙවීම් (වියදම්) රු. 8,712,800 ක් ද ලෙස දැක්වීම හේතුවෙන් ඒ අතර රු. 235,800 ක් වූ වෙනස වර්ෂයේ ඌනතාවය අඩුවීම කෙරෙහි බලපා තිබූ අතර මහපොළ ලැබීම් හා ගෙවීම් නිසි ලෙස ගිණුම් නොතැබීම ඊට හේතුවී තිබුණි.

(ඉ) 2011 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා ගෙවිය යුතු රු.1,764,620 ක් වූ ආරක්ෂක සේවා වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) අත්පත්කර ගත් වටිනාකම අනුව එතෙක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබූ ආයතනයට අයත් ඉඩම් අක්කර 10 රූඩ් 03 පර්චස් 2.1 ක් 2011 ජනවාරි 01 දිනට රු. 1,120,500,000 කට තක්සේරු කර එම සම්පූර්ණ වටිනාකමම ආයතනයේ ප්‍රාග්ධනය ලෙස නොසලකා ප්‍රත්‍යාගණන සංචිත ගිණුම බැර කර තිබුණි.

### 2.2.3 නොසැසඳුනු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වෙන පහත සඳහන් ගිණුම් විෂයයන් අදාල උපයෝගී ලේඛන / වාර්තා සමඟ නොසැසඳීම් නිරීක්ෂණය විය.

| | ගිණුම් විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපයෝගී ලේඛන/ වාර්තාව | උපයෝගී ලේඛනය / වාර්තාවේ සඳහන් වටිනාකම | වෙනස |
|---|---|---|---|---|---|
| | | රු. | | රු. | රු. |
| (අ) | ආපදා ණය | 16,965,622 | උපලේඛනය | 16,972,856 | 7,234 |
| (ආ) | වාහන ණය | 1,836,180 | එම | 1,842,885 | 6,705 |
| (ඇ) | සේවක ණය | 351,038 | එම | 295,970 | 53,538 |
| (ඇ) | පරිගණක ණය | 988,460 | එම | 982,500 | 4,960 |
| (ඉ) | උත්සව අත්තිකාරම් | 216,248 | එම | 173,300 | 42,948 |
| (ඊ) | විලම්භිත ආදායම් - භෛසජ්ජ ඩිප්ලෝමා පාඨමාලාව (පැරණි) | 857,355 | ලේඛනය | 1,320,038 | 462,683 |
| (උ) | ගබඩා අත්තිකාරම් | 1,655,564 | 2012 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව | 1,011,402 | 644,162 |

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

නිලධාරීන් 02 දෙනෙකු වෙත ලබාදී තිබූ රු.530,030 ක් වූ සේවක ණය වසර 09 ක් දක්වා කාලයක් හිඟහිටව පැවතුණද, එම ණය අයකර ගැනීමට සක්‍රීයව ක්‍රියාකර නොතිබුණි.

2.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 372 (2) (ආ) | එක් අවස්ථාවකදී රු.20,000 කට වැඩි අත්තිකාරම් ලබාදිය නොහැකි වුවත් අවස්ථා 15 කදී රු.21,250 සිට රු.90,000 දක්වා එකතුව රු.657,250 ක්වූ අත්තිකාරම් මුදල් ලබාදී තිබුණි. |
| (ii) මු.රෙ. 507 හා 756 | සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.17,642,680 ක් වූ පුස්තකාල පොත් සම්බන්ධ සමීක්ෂණයක් ආරම්භයේ සිට මේ දක්වාම සිදුකර නොතිබුණි. |
| (ආ) 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364 (3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රු.25,000 ඉක්මවා ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබඳ මාසික වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් වෙත යවා නොතිබුණි. |
| (ඇ) 1997 ජනවාරි 15 දිනැති අංක 8/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2002 ඔක්තෝබර් 16 දිනැති 09/2002 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | ඒ ඒ නිලධාරියා විසින් ඉටුකල යුතු කාර්යයන් පිළිබඳ ඇගයීමකින් තොරව 70 ක්වූ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 63 දෙනෙකු සඳහාම සාමාන්‍ය රාජකාරි කටයුතු සඳහා මසකට පැය 20 ඉක්මවා රු.2,382,992 ක් වූ අතිකාල මුදලක් ගෙවා තිබූ අතර, 2009 හා 2010 වර්ෂයන්හි මේ ආකාරයට සිදුකල ගෙවීම් පිළිවෙලින් රු.2,463,589ක් හා රු.2,711,343 ක් වී තිබුණි. |

2.2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් පර්යේෂණ කටයුතු සඳහා ලැබී තිබූ නමුත් එම කාර්යයට නොයොදවා 2006 වර්ෂයේ සිට බැංකු ජංගම ගිණුමක නිශ්ක්‍රීයව තබා තිබූ රු.664,820 ක් වූ මුදල් ශේෂය, කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2011 ආයුර්වේද වෛද්‍ය ප්‍රදර්ශන ගිණුමට මාරුකර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යායතනයේ කටයුතුවලින් සිදුවී ඇති මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.165,903,410 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.142,942,199 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.140,055,816 ක් වූ රජයේ ප්‍රදානය හේතු කරගෙන එම ඌනතාවය රු.25,847,594 ක් දක්වා අඩුවී තිබුණු අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.104,100,000 ක් වූ රජයේ ප්‍රදානය හේතු කරගෙන එම ඌනතාවය රු.38,842,199 ක් දක්වා අඩුවී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඌනතාවය රු.12,994,605 ක් දක්වා අඩුවී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් තැබීමේ ප්‍රතිපත්තිය " අයභාර පදනම " ලෙස වෙනස් කිරීම නිසා රු.24,455,028 ක් වූ වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීම් නැවත මෙහෙයුම් ආදායමට ගැලපීම ඊට හේතුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අධ්‍යාපන කටයුතුවල නිරත 647 ක්වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව ආයතනය දැරූ පුනරාවර්තන වියදම රු.147,735,489 ක් වූයෙන් ඒකක ශිෂ්‍ය පිරිවැය රු.228,339 ක් වී තිබුණි.

(ආ) ලියාපදිංචි වූ සිසුන් පාඨමාලාව සාර්ථකව අවසන් නොකර අධ්‍යාපන කටයුතු හැර යන තත්ත්වයක් ද විභාග අසමත්වන තත්ත්වයක්ද පසුගිය වර්ෂ කිහිපය තුළම වර්ධනය වෙමින් පැවති අතර, ඒ පිළිබඳව කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

| ඇතුළත්වූ අධ්‍යයන වර්ෂය | ඇතුළත්වූ සංඛ්‍යාව | 5 වන වසර රැඳී සිටි සංඛ්‍යාව | 5 වන වසර සමත්වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 2004 / 2005 | 107 | 81 | 41 |
| 2003 / 2004 | 102 | 67 | 45 |
| 2003 / 2004 (A) | 78 | 62 | 50 |
| 2002 / 2003 | 95 | 86 | 63 |
| 2001 / 2002 | 101 | 80 | 58 |
| 2000 / 2001 | 98 | 54 | 43 |

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

### (අ) පිරිමි නේවාසිකාගාරය නඩත්තු කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 1995 ජනවාරි 11 දින ආයතනය වෙත භාර දෙනු ලැබූ කාමර 28 ක් සහිත ගොඩනැගිල්ලක පවත්වාගෙන එනු ලබන පිරිමි නේවාසිකාගාරය, නේවාසිකාගාරයකට සුදුසු පරිදි වැඩිදියුණු කර නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ආයතනය විසින් වාර්ෂිකව සිසුන් ලියාපදිංචි කර නේවාසිකාගාරයට එවීම වෙනුවට සිසුන් නේවාසික වීමෙන් පසුව ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි.

### (ආ) ස්ථාවර වත්කම් ලේඛනගත කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ස්ථාවර වත්කම් සමීක්ෂණයෙන් අනතුරුව ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කර තිබූ නමුත් එය 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 හි ඇතුළත් පොදු ආකෘතිපත්‍ර 287 ට අනුකූල නොවීය.

(ii) එම සමීක්ෂණයේදී පාවිච්චි කල නොහැකි, වත්කම් ලෙස හඳුනා ගන්නා ලද රු.1,193,625 ක අගයකට තක්සේරු කරන ලද වත්කම් ඒකක 172 ක්, අපහරණය ක්‍රමය හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතුකර නොතිබුණි.

(iii) වක්‍රලේඛ උපදෙස් පරිදි පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ලේඛනයක්ද, වර්ගීකරණ ලෙජර් ගිණුම්ද තබත්තු කර නොතිබුණි.

### 4.3 අරමුදල් ඌන උපයෝජනය

ආයතනයේ සාමාන්‍ය මාසික ගෙවීම් රු. 2,175,000 ක් වු බැංකු ජංගම ගිණුම් දෙකක රු.6,765,000 ක සාමාන්‍ය මාසික මුදලක් පැවති අතර අතිරික්ත මුදල් ආයතනයේ මූල්‍යමය අවශ්‍යතාවයන් සඳහා ඵලදායි ලෙස යෙදවීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

### 4.4 ආර්ථික නොවු ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තෙකලා විදුලිය ලබා ගැනීම සඳහා වයර් මීටර් 76 ක් අවශ්‍යතාවයට වැඩියෙන් මිළදී ගැනීම නිසා ගෙවු රු.282,492 ක් නිෂ්කාර්යය වියදමක් වී තිබුණි.

(ආ) අවම මිල ප්‍රතික්ෂේප කිරීමට හේතු නොදක්වා එම වර්ගයෙන්ම ජායා පිටපත් කඩදාසි පැකට් 350 ක් මිලදී ගැනීම නිසා රු.17,500 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි.

(ඇ) මිල ගණන් ලබා නොගෙන රු.578,048 ක් ගෙවා භාණ්ඩ වර්ග 06 ක් මිලදී ගැනීම හා එහි ඇතුළත් රු.166,500 ක් මිල වු යකඩ ඇඳන් 10 ක් පරිහරණයට අපහසු බවට වාර්තා වී තිබුණි.

### 4.5 හඳුනා ගන්නා ලද පාඩු

හිටපු මූල්‍යාධිකාරී විසින් පාලක සභාවේ අනුමැතියකින් තොරව ආරක්ෂක සේවා ආයතනය නමට ලියන ලද ගෙවීම් වවුචරයෙන් අඩු කොට මුදල් රෙගුලාසිවලට පටහැනිව අධ්‍යක්ෂවරයා වෙත රු. 282,060 ක් ගෙවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුනොකර ඊට දඬුවමක් ලෙස විශ්‍රාම යාමට ආසන්නව සිටි මූල්‍යාධිකාරීට හිමි වැටුපෙන් හෝ සේවක අර්ථ සාධක අරමුදලෙන් අඩුකිරීමට තීරණය කිරීම වෙනුවට 1992 අංක 62 දරන පාර්තෝෂික ගෙවීම් පනතට අනුකූල නොවන පරිදි පාර්තෝෂික මුදල් අඩුකිරීමට 2010 අගෝස්තු 11 දින කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය හේතුවෙන් මූල්‍යාධිකාරී වෙත රු. 122,762 ක් වු අධිභාර මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

## 4.6 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව එක් සැපයුම්කරුවෙකුගෙන්ම වරින්වර මිල ගණන් තුනක් බැගින් ලබාගෙන අවස්ථා 06 කදී රු. 413,985 ක් ගෙවා රතුපස්, ගල් හා වැලි කියුබ් 133 ක් ද්‍රව්‍ය ලැබීම් පිළිබඳ අධීක්ෂණයකින්ද තොරව මිලදී ගෙන තිබුණු අතර එයින් අවස්ථා දෙකකදී තෝරාගත් වෙනස් මිල ගණන් දෙකක් සඳහා වවුචරයේ මුදල් ලබාගත් බවට වූ අත්සන එකම සැපයුම්කරුවෙකුගේ බවට නිරීක්ෂණය වීම හා අනෙකුත් සෑම අවස්ථාවන්හිදීම සැපයුම්කරු එම පුද්ගලයාම වී තිබුණි.

## 4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන පිවිසුම් දොරටුව ඇතුළු කොන්ත්‍රාත් පහක් එක් ගිවිසුමක් යටතේ, සැලසුම් අනුමත කිරීමකින් ද නාගරික සංවර්ධන අධිකාරිය හා පහත් බිම් සංවර්ධන මණ්ඩලයේ අනුමැතියකින් තොරවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලින් බැහැරව පත්කරන ලද කොන්ත්‍රාත් උපදේශකගේ රු.6,700,000 ක් වූ පිරිවැය ඇස්තමේන්තුවට වඩා 34% ක් අඩු වූ රු. 4,395,894 ක් වු අවම මිලට තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිරීක්ෂණයට ලක් නොකර, කොන්ත්‍රාත්තුව පවරා තිබු අතර එම කොන්ත්‍රාත් වටිනාකමෙන් රු.3,315,740 ක් වූ වැඩ සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව කොන්ත්‍රාත් මිලෙන් 67% ක් වු රු. 2,964,778 ක් වටිනා අතිරේක වැඩ කරවා ගැනීමෙන් අනතුරුව ආයතන ප්‍රධානියාගේ වාචික උපදෙස් මත කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණි.

(ආ) අත්හිටවූ කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ ඉටුකර ගැනීම සඳහා ගෙවු රු.996,468 ක් ඇතුළුව කොන්ත්‍රාත්තුව අවසන් වනවිට වැට් බදු හැර රු. 7,276,986 ක් ගෙවා තිබු අතර එය රු.4,395,894 ක් වු කොන්ත්‍රාත් මිලට වඩා 65% ක් ඉක්මවා තිබුණි.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 දෙසැම්බර් 31 දිනට 205 ක් වූ අනුමත මුළු කාර්ය මණ්ඩලයෙන් තනතුරු 42 ක් පුරප්පාඩු වී තිබුණි.

| | අනුමත සේවක සංඛ්‍යාව | තත්‍ය සේවක සංඛ්‍යාව 2011 දෙසැම්බර් 31 දිනට | පුරප්පාඩු සංඛ්‍යාව 2011 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|
| අධ්‍යයන හා සහාය කාර්ය මණ්ඩලය | 101 | 79 | 22 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 104 | 84 | 20 |
| | 205 | 163 | 42 |

(ආ) 1997 නොවැම්බර් 21 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 අනුව II ශ්‍රේණියේ තාවකාලික කථිකාචාර්යවරයෙකු එම තනතුරෙහි ස්ථිර කිරීම සඳහා තම ක්ෂේත්‍රයට අදාල වන පශ්චාත් උපාධියක් හැදෑරිය යුතු වුවද, වෙනත් ක්ෂේත්‍රයකට අදාල වූ "තුලනාත්මක නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය" හැදෑරූ කථිකාචාර්යවරයකු II ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරෙහි ස්ථිර කර තිබුණි.

4.9 වාහන උපයෝජනය

------------------------

ආයතනයේ වාහන 04 ක් සඳහා වාහන ධාවන සටහන් හා ලොග් පොත් ක්‍රමානුකූලව නඩත්තු කර නොතිබූ අතර, නියමිත කාලයක් තුළ වාහන ඉන්ධන පරීක්ෂාවන්ද සිදුකර නොතිබුණි.

5. ගිණුම්කරණ කටයුතුභාවය සහ යහපාලනය

--------------------------------------------------

5.1 සංයුක්ත සැලැස්ම

---------------------

සංයුක්ත සැලැස්ම, අයවැය ලේඛනය හා කාර්යසාධනය කාලීනව සමාලෝචනය කිරීමද සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීමද සිදුකර නොතිබූ අතර, කාර්යසාධන වාර්තා සකස් කර නොතිබුණි.

5.2 ක්‍රියාකාර සැලැස්ම

----------------------

අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීම සඳහා පැහැදිලිව වගකීම් පැවරෙන පරිදි නිලධාරීන් ඇතුළත්ව හා ඇස්තමේන්තුගත වටිනාකම් සහිත ක්‍රියාකාර සැලැස්මක් සකස් කර නොතිබුණි.

5.3 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනයේ අයවැය ලේඛනය සකස් කිරීමේදී යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුගමනය කර නොතිබුණි.

(ආ) අයවැයගත වියදම් ශීර්ෂ 04 ක අයවැයගත හා තථ්‍ය ආදායම් අතර 14% සිට 69% දක්වා වූ විචලනයන් පැවතීමත් තත්‍ය ආදායම, අයවැයගත ආදායමට වඩා 46% කින් පහළ මට්ටමක පැවතීමත් හේතුවෙන් අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2009 හා 2010 වර්ෂයන්හි වාර්ෂික වාර්තා සභාගතකර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) කාර්යසාධනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) ප්‍රසම්පාදන කටයුතු
(ඉ) මූල්‍ය පාලනය
(ඊ) ගබඩා පාලනය
(උ) අත්තිකාරම්
(ඌ) ජේටක ණය
(එ) සැලසුම් සකස් කිරීම

එච්.ඒ.එස්. සමරවීර
විගණකාධිපති

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යායතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවට පිළිතුරු

| | |
|---|---|
| **2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති.**<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>(අ) සමාලෝචිත වර්ෂය ආරම්භය දක්වා ආයතනය. විසින් රජයේ ප්‍රාග්ධන ප්‍රධාන ගිණුම් තැබීමේදී අනුගමනය කළ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති 24 පරිදි වූ ප්‍රාග්ධන පදනම එම ප්‍රමිතියෙහි වූ අයහාර පදනම ලෙස කලමනාකරණ මණ්ඩලයේ අනුමැතියකින් තොරව වෙනස් කර තිබූ අතර ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති 10ට අනුව එමගින් මූල්‍ය ප්‍රකාශනවලට සිදුවූ බලපෑම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණි. එසේම ගිණුම්වල පැවති පහත සඳහන් අඩුපාඩු නිරාකරණය කර ගැනීමකින් තොරව මෙම ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කර තිබුණි. | **2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්.**<br><br>(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24 පරිදි අංක 365/19 කළමණාකරණ පත්‍රිකාව මගින් කළමණාකරණ මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කර ඇත.<br><br>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 10 අනුව ඒමගින් මූල්‍ය ප්‍රකාශනවලට සිදු වූ බලපෑම මූල්‍ය ප්‍රකාශනයේ පිටු අංක 03 මගින් හෙළිදරව් කර ඇත.<br><br>රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක PED 19 මගින් යහ පාලනය සම්බන්ධයෙන් 2003 වසරේ නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් හා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් 2006 වසරේ නිකුත් කර ඇති නව ගිණුම්කරණ ප්‍රමිතිවල ගිණුම්කරණ ප්‍රමිති 03 යටතේ සෑම විශ්වවිද්‍යාලයක්ම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු වුවද මෙම ආයතනය 2009/12/31 දින දක්වා එම උපදෙස් ක්‍රියාත්මක නොකිරීම නිසා ස්ථාවර වත්කම් ලේඛනයේ අඩුපාඩු සිදු වී ඇති බව අදහස් කරමි.<br><br>PED 19 චක්‍රලේඛ පිටපතක් මේ සමග අමුණා ඇත. (ඇමුණුම් අංක 01) |
| (I) 2011 ජනවාරි 01 දිනට ශුද්ධ අගය රු. 76,681,308.00 ක් වූ ස්ථාවර වත්කම් වර්ග 05ක් ඉදිරි ඵලදායී ජීවිත කාලය සැලකිල්ලට නොගෙන රු. 318,070,239.00 කට ප්‍රත්‍යාගණනය කිරීම නිසා කෙටි ජීවිත කාලයක් සහිත වත්කම් ලෙස සලකා ක්ෂය අනුපාතයක් මත සම්පූර්ණ ඵලදායී ජීවිත කාලයක් සහිත වත්කම් ලෙස සලකා ක්ෂය ගණනය සිදු කර තිබීම. | (I) 2011 වසරේදී පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයේ වත්කම් මිල දී ගත් වර්ෂය සඳහන් කර තිබූ සියලුම වත්කම් ජීවිත කාලය සලකා ක්ෂය ප්‍රතිපාදන කර ඇති බව සඳහන් කරමි.<br><br>වත්කම් මිල දී ගත් වර්ෂය හා දිනය සොයා ගත නොහැකි වත්කම් සම්බන්ධයෙන් 2011 වර්ෂයේ තක්සේරු කර ඇති මිල ගණන් සැලකිල්ලට ගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති කොමිෂන් සභා චක්‍රලේඛ 649 මගින් ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කර ඇති බව දන්වනු කැමැත්තෙමි.<br><br>(කොමිෂන් සභා චක්‍රලේඛ 649 පිටපතක් අමුණා ඇත. ඇමුණුම් අංක 02) |
| (II) ප්‍රත්‍යාගණිත ස්ථාවර වත්කම් ගිණුම් තුළ පැවති තෑග හා ප්‍රදාන හඳුනා නොගැනීම. | (II) ප්‍රත්‍යාගණිත කිරීමේදී තෑග හා ප්‍රධාන එම ප්‍රත්‍යාගණිත වටිනාකමින් ඉවත් කර ඇත. 2011/12/31 දිනෙන් අවසන් වූ වසරේ මූල්‍ය ප්‍රකාශන පිටු අංක 10, සටහන් අංක 09 හා පිටු අංක 20 හි Schedule L මගින් අවශ්‍ය විස්තර සපයා ඇති බව දන්වමි. |
| (III) 2011 දෙසැම්බර් 31 දිනට පැවති වත්කම් ක්ෂය ක්‍රමක්ෂය කිරීමේදී රජයේ ප්‍රාග්ධන ප්‍රදාන, තෑග හා ප්‍රදාන සහ ප්‍රත්‍යාගණන සංචිතය යන ගිණුම් තුනටම ගැලපිය යුතු වුවත් රු. 24,455,029.00 ක් වූ සම්පූර්ණ ක්‍රමක්ෂය වටිනාකම රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට පමණක් ගලපා තිබීම. | (III) රාජ්‍ය ප්‍රධාන හා තෑග ප්‍රධාන සඳහා මුලු ක්ෂය ප්‍රමාණය රු. 26,639,717.00 කි. තෑග හා ප්‍රධානවල ක්ෂය ප්‍රමාණය රු. 2,184,689.00 වේ. තෑග හා ප්‍රධාන වලට අදාළ ක්ෂය ඉවත් කොට රාජ්‍ය ප්‍රධානවලට පමණක් අදාළ වූ රු. 24,455,027.00 මුදල පමණක් රජයේ ප්‍රාග්ධන ගිණුමට ගලපා ඇත. |

| | |
|---|---|
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 29 අනුව සාධාරණ පදනමකට ගිණුම් කාල පරිච්ඡේද අතර පැහැදිලිව බෙදා වෙන් කළ හැකිව තිබූ, 2011 වර්ෂයේ අවසන් වූ පාඨමාලා දෙකක් සහ 2011 ජූලි - 2013 ජූලි අතර කාලය තුළ පැවැත්වෙන පාඨමාලාවක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 4,027,225.00 ක් වුවද, එම පාඨමාලාවන්හි වියදම වූ රු. 2,339.174.00 කට සමාන ප්‍රමාණයක් පමණක් ආදායම ලෙස ගිණුම් ගත කර තිබුණි. | (ආ)<br>ශ්‍රී ලංකා ගිණුම් කරණ ප්‍රමිති අංක 29 අනුව සාධාරණ පදනමකට ගිණුම්කාල පරිච්ඡේද අතර පාඨමාලා බෙදා වෙන් කර ඇත. 2011 වර්ෂයේ මුළු ආදායම රු. 3,934,821.00 උපචිත ආදායම් ලෙස ගිණුම් කර ඇත.<br><br>ඉහත පාඨමාලාව වලට අදාළ ඉදිරි ගෙවීම් සඳහා රු. 1, 847,189.00 ක් උපචිත ආදායම්- ලෙස ගිණුම් කර ඇත. |
| **2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**<br><br>පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ. | **2.2.2 ගිණුම්කරණ අඩුපාඩු** |
| (අ) පෙර වර්ෂයන්හි පිරිවැය හෝ ක්ෂය ගැලපීම්වල සිදු වී තිබූ වැරදීම් හේතුවෙන් ඵලදායී ජීවිත කාලය අවසන් නොවූ වාහන වල ශුද්ධ අගය ශුන්‍ය ලෙසට දැක්වීමේ වරද නිවැරදි කිරීමකින් තොරව ප්‍රත්‍යාගණන අගයන් ගැලපීම හේතුවෙන් රු. 4,838,830.00 ක් ලෙස ගණනය කළ වාහන ප්‍රත්‍යාගණන ලාභය නිවැරදි නොවන බවට නිරීක්ෂණය විය. | (අ)<br>2009 වසරේ මෝටර් රථ ක්ෂය ගිණුම පරීක්ෂා කර 2012.12.31 දිනෙන් අවසන් වන වසරේ මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කරනු ඇත. |
| (ආ)<br>(1) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 99 වගන්තිය අනුව සියලු ලැබීම් ආයතනයේ අරමුදලට බැර කලයුතු වුවද, ඉන් බැහැරව, ආයතනයේ අරමුදලට බැර වියයුතු රු. 451,490 ක් යොදා අධ්‍යක්ෂ අරමුදල හා අංශ සංවර්ධන අරමුදල නමින් අරමුදල් 02ක් ඇති කර තිබුණි. | (ආ)<br>(1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 64-14 හා 79-12.21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් දේශීය වෛද්‍ය ආයතනයේ කළමණාකරන මණ්ඩලයට ලබා දී ඇති බලතල යටතේ ආයතනයේ මූල්‍ය පාලනය කළමණාකරන මණ්ඩලයේ උපදෙස් මත කල යුතු වේ. ඒ අනුව 2011.02.28 දින පැවති 354 වන රැස්වීමේ දී අධ්‍යක්ෂ අරමුදල හා අංශය සංවර්ධන මුදල නමින් ලෙජර් ගිණුම් දෙකක් ඇති කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. මෙම ලෙජර් ගිණුම් දෙකකට ඇතුලත් කරනු ලබන සියලු මුදල් ආයතනයේ සංවර්ධනය කටයුතු සඳහා කළමණාකරන මණ්ඩලයේ උපදෙස් පරිදි කටයුතු කරනු ඇත. |
| (ආ)<br>(11) පාඨමාලාවේ සිසුන් 14 දෙනෙක් සඳහා 2012 වර්ෂය වෙනුවෙන් ලැබී තිබුනු රු. 455,000.00 ක් රු. 210,000.00 ක් වශයෙන් ඉදිරියට ලැබීම සටහන් කිරීමෙන් රු. 245,000.00 සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩියෙන්ද, 2011 දෙසැම්බර් 31 දිනට සිසුන් 09 දෙනෙකුගෙන් ලැබිය යුතු රු. 157,500 ක පාඨමාලා ගාස්තු රු. 315,000.00ක් වශයෙන් සටහන් කිරීමෙන් තවත් රු. 157,500.00 කින් ආදායම වැඩියෙන් සටහන් කර තිබුණි. | (ආ)<br>(11) පශ්චාත් උපාධි නව පාඨමාලාවේ සිසුන් 14 දෙනෙකු සඳහා 2011 වසරේ ලද ආදායම් පහත සඳහන් පරිදි වේ.<br><br>2011 වර්ෂයට ආදායම = (රු. 748,000.00)<br>පාඨමාලාව අත්හැර යාම වෙනුවෙන් සිසුවෙකුට ආපසු ගෙවිය යුතු මුදල } = (රු. 59,200.00)<br>පාඨමාලාව සඳහා කලින් ලද ආදායම = (රු. 882,791.00)<br><br>2011 වසරේ ලෙජර් ගිණුම අනුව ලද මුළු ආදායම = <u>රු. 1,689,991.00</u><br><br>ලෙජර් ගිණුම් අනුව 2011 වර්ෂයේ ඉහත ආදායම . වැඩියෙන් සටහන් කිරීමක් කර නොමැත. |

| | |
|---|---|
| (ඇ)<br>(1) පශ්චාත් උපාධි නව පාඨමාලාව සඳහා ශිෂ්‍යයෙකු විසින් 2012 නොවැම්බර් 24 දින ගෙවූ නමුත් ඉදිරියට ලැබීම ලෙස එම අවස්ථාවේ ගිණුම්ගත නොකල රු. 23.750 ක් සමාලෝචිත වර්ෂයේදී නිවැරදිව ගිනුම් නොගැලපීම හා 2011 දෙසැම්බර් මස 31 දිනට ලැබිය යුතු පාඨමාලා ගාස්තු රු. 44.000 ක් ගිනුම්ගත නොකිරීමත් හේතුවෙන් රු. 67.750කින් ඉදිරියට තැබූ ආදායම් අඩුවෙන් ගිනුම්ගත කර තිබුණි. | (ඇ)<br>(1) පශ්චාත් උපාධි නව පාඨමාලාව සඳහා ලියාපදිංචි වී ආයුර්වේද වෛද්‍ය විශාරද පාඨමාලාවට මාරු වූ සිසුවෙකු වෙනුවෙන් ඔහු විසින් ගෙවා ඇති පාඨමාලා ගාස්තුව රු. 59.200.00කි. එය කාර්යාලිය ප්‍රමාද දෝෂයක් හේතු කොට ගෙන රු. 80.000.00 ලෙස සටහන් කර ඇතත් එම වෙනස රු. 20.800.00 ජර්නල් අංක 0213 මගින් මේ වන විටත් නිවැරැදි කර ඇත. |
| (11) පශ්චාත් උපාධි පාඨමාලාවේ සමාලෝචිත වර්ෂයට අදාල ආදායම වියදම රු. 1.207.491 ක් වුවද, එය රු. 950.749ක් ලෙසද රු. 256.742ත් අඩුවෙන් ද එම පඨමාලාව සඳහා ලියාපදිංචි වී වෙනත් පාඨමාලාවකට මාරු වූ ශිෂ්‍යයෙකු විසින් 2012 වර්ෂයේ දී ගෙවූ රු. 20.800ක මුදල සමාලෝචිත වර්ෂයේ දී ගෙවිය යුතු ආදායම් ලෙසද ගිනුම්ගත කර තිබුණි. | (11) 2011.12.31 දිනෙන් අවසන් වූ වසරේ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 07හි සඳහන් කර ඇති විලම්බිත ආදායම් පශ්චාත් උපාධි රු.256.742.00ක මුදල ජර්නල් අංක. 0210 මගින් මේ වන විටත් නිවැරැදි කර ඇත. |
| (ඇ) (1) 2005 ජනවාරි 31 දිනැති අංක 856 දරන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව ගෙවූ ශිෂ්‍යාධාර පමණක් ප්‍රතිපූර්නය කර ගැනීමට ඉල්ලුම් කල යුතු වුවත් . ලියාපදංචි ශිෂ්‍ය සංඛ්‍යාව මත ප්‍රතිපූර්ණය කිරීම හේතුවෙන් ඉතිරිවූ රු. 159.800ක් ශිෂ්‍යාධාර තැන්පතු (නොගෙවූ) ගිනුමේ රඳවා ගෙන තිබුණි. | (ඇ)(1) ශිෂ්‍යධාර තැන්පත් (නොගෙවූ) ගිණුමේ ශේෂය රු. 183.500.00 වන අතර 2012 වසරේ දී මෙම මුදල් සිසුන් විසින් ඉල්ලුම් නොකළහොත් එම මුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ගෙවීම් කිරීමට කටයුතු කරනු ඇත. |
| (ඇ) (11) ආදායම් හා වියදම් ගිණුමෙහි සමාලෝචිත වර්ෂයේ මහපොල ලැබීම් (ආදායම්) රු. 8.948.600ක් ද එම ගෙවීම් (වියදම් )රු. 8.712.800ක් ද ලෙස දැක්වීම හේතුවන් ඒ අතර රු. 235.800 ක් වූ වෙනස වර්ෂයේ ඌණතාවය අඩු වීම කෙරේ බලපා තිබූ අතර මහපොල ලැබීම් හා ගෙවීම් නිසිලෙස ගිණුම් නොතැබූම ඊට හේතු වී තිබුණි. | (ඇ) (11) ආදායම් හා වියදම් ගිණුමෙහි සමාලෝචිත වර්ෂයේ මහපොළ ලැබීම (ආදායම්) ලෙස ඔබ විසින් දක්වා ඇති රු. 8,8,948,600 මුදල මහපොළ හා ශිෂ්‍යධාර ආදායම් ලෙස නිවැරදි විය යුතු අතර රු. 8712800.00 ලෙස දක්වා ඇති ගෙවීම් ද ඒ අයුරින් ම නිවැරදි විය යුතු වේ. ඉතිරි වී ඇති රු. .235.800.00 සිසුන් වෙත 2012 වසරේදී ගෙවීමට කටයුතු කරනු ඇත. |
| (ඉ) 2011 ඔක්තොම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා ගෙවිය යුතු රු. 1.764.620ක් වූ ආරක්ෂක සේවා වියදම් ගිණුම් ගත කර නොතිබුනි. | (ඉ) 2011 ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා ආරක්ෂක සේවා වියදම රු. 1.764.620.00 මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කිරීමට නොහැකි වූයේ එම බිල්පත් 2011.12.31 දිනට ලැබී නොතිබීමත් ආරක්ෂක සේවා ගිවිසුම අත්සන් කර නොමැති බැවිනි. |
| (ඊ) අත්පත්කර ගත් වටිනාකම අනුව එතෙක් ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබූ ආයතනයට අයත් ඉඩමු අක්කර 10 රූඩ් 03 පර්චස් 2.1 ක් ජනවාරි 01 දිනට රු. 1.120.500.000 කට තක්සේරු කර එම සම්පූර්ණ වටිනාකම ආයතනයේ ප්‍රාග්ධනය ලෙස නොසලකා ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට බැර කර තිබුණි. | (ඊ) ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති 18 හි ඡේද අංක 31 , 39 හා 40 අනුව වත්කම් ගිණුම් තැබීමේදී ලබා දී ඇති උපදෙස් සැලකිල්ලට ගෙන 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන සංචිතය ගැලපීම් කර ඇත.<br>(ශ්‍රී ලංකා ගිණුම් කරන ප්‍රමිති 18 ඇමුණුම් අංක 03) |

2.2.3 නොසැසදුනු පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන පහත සදහන් ගිණුම් විෂයයන් අදාල උපයෝගී ලේඛන වාර්තා සමග නොසැසදීම් නිරීක්ෂණය විය.

| ගිණුම් විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය රු. | උපයෝගී ලේඛන/වාර්තාව | උපයෝගී ලේඛන/වාර්තාවේ සදහන් වටිනාකම | වෙනස |
|---|---|---|---|---|
| (අ) ආපදා ණය | 16.965.622 | උපලේඛනය | 16.972.856 | 7.234 |
| (අ) වාහන ණය | 1.836.180 | එම | 1.842.885 | 6.705 |
| (ඇ) සේවක ණය | 351.038 | එම | 295.970 | 53.538 |
| (ඇ) පරිගණක ණය | 988.460 | එම | 982.500 | 4.960 |
| (ඉ) උත්සව අත්තිකාරම් | 216.248 | එම | 173.300 | 42.948 |
| (ඊ) විලම්බිත ආදායම්- හෞමප්ප ඩිප්ලෝමා පාඨමාලාව (පැරණි) | 857.355 | ලේඛනය | 1.320.038 | 462.683 |
| (උ) ගබඩා අත්තිකාරම් | 1.655.564 | 2012 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව | 1.011.402 | 644.162 |

2.2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

නිලධාරීන් 02 දෙදෙනෙකු වෙත ලබා දී තිබූ රු. 530,030 ක් වූ සේවක ණය වසර 09 ක් දක්වා කාලයක් හිඟහිටව පැවතුනද, එම ණය අයකර ගැනීමට සක්‍රියව ක්‍රියාකර නොතිබුණි.

2.2.3 පහත සදහන් ගිණුම් ශේෂයන් සම්බන්ධයෙන් විස්තර කිරීම් පහත සදහන් පරිදි වේ.

| ගිණුම් විෂය | වෙනස | පැහැදිලි කිරීම |
|---|---|---|
| අ. ආපද ණය | රු. 9,849.00 | |
| ආ. වාහන ණය | රු. 6,705.00 | විස්තර සොයා ගැනීමට නොමැති වූ |
| ඇ. සේවක ණය | රු. 53,538.00 | බැවින් 03 වන මුදල් කමිටුවේ |
| ඈ. පරිගණක ණය | රු. 4,960.00 | නිර්දේශය මත 372 කළමණාකර |
| ඉ. උත්සව අතිකාරම් | රු. 42,948.00 | මණ්ඩලයේ අනුමැතිය සහිතව පොත්වලින් ලියා හැරීමට කටයුතු කරනු ඇත. |

ඊ. විලම්භිත ආදායම් හෞමප්පක ඩිප්ලෝමා පාඨමාලාව (පැරණි) රු. 462,683.00

මුදල් අය කර පවත්වනු ලබන පාඨමාලාව වෙනුවෙන් ආයතනය විසින් දරා ඇති වියදම් වන ලිපිද්‍රව්‍ය, දුරකථන බිල්, විදුලිය හා ජලය, අධ්‍යක්ෂ අරමුදල හා අංශය සංවර්ධන අරමුදල සදහා පාඨමාලාවෙන් ලැබිය යුතු මුදල ජර්නල් අංක 4767 මගින් මේ වන විට ගැලපීම් කර ඇත.

උ. ගබඩා අත්තිකාරම් රු. 644,162.00

මෙම වෙනස සොයා ගෙන ඇති අතර පිටපත අමුණා ඇත.(ඇමුණුම් අංක IV)

2.2.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

රු. 530,030.00 ක් නිලධාරීන් දෙනෙකු වෙත ලබා දී තිබූ සේවක ණය සම්බන්ධයෙන් පිළිතුරු පහත සදහන් කරනු කැමැත්තෙමි.

(1) වෛද්‍ය බී. රොෂානා අමීර් මිය - සේවය අතහැර ගොස් ඇත. අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදී ඇයගේ අනුමැතිය සහිතව ආයතනය වෙත ලැබිය යුතු රු. 363,474.00 මුදල අය කර ගැනීමට කටයුතු කර ඇත. ඔබ විසින් දක්වා ඇති වසර 09 ක් යන්න සාවද්‍ය වේ. දැනට අවු. 02 මාස 03 ගත වී ඇත.

(2). දෙනපාල මහතා - වැටුප් රහිත නිවාඩු ලබාගෙන විදේශ ගතව ඇත. ඔහු වෙත ගෙවා ඇති රු. 166,556.00 මුදල නැවත සේවයට පැමිණි දින සිට හිඟ ණය මුදල් පොළී සමග අයකර ගනු ලැබේ. ඔබ විසින් දක්වා ඇති අවු. 09 සාවද්‍ය වේ. හිඟ කාලය අවු. 01 මාස 06 ක කාලයක් ගත වී ඇත.

| | |
|---|---|
| **2.2.5 නීති රීති, හා රෙගුලාසි** | **2.2.5 නීති රීති, හා රෙගුලාසි** |
| පහත සදහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය. | |
| නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව. | නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව. |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි |
| (I) මු.රෙ..372 (2) (ආ) | (1) මු.රෙ 372 (2) (අ) |
| එක් අවස්ථාවකදී රු. 20,000 කට වැඩි අත්තිකාරම් ලබාදිය නොහැකි වුවත් අවස්ථා 15 කදී රු. 21,250 සිට රු. 90,000 දක්වා එකතුව රු. 657,250 ක්වූ අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි | මෙම ආයතනය අධ්‍යාපන ආයතනයක් බැවින් සිසුන්ගේ අවශ්‍යතා අනුව රු. 20,000.00 ඉක්මවා අත්තිකාරම් ගෙවීමට සිදු වනු ඇත. ආයතනයේ අරමුණු කරා ළගා වීමේදී එවැනි තත්වයන් සිදු වන බව කාරුණිකව දන්වමි. කෙසේ වෙතත් මෙම තත්වය පාලනය කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. |
| (II) මු.රෙ..507 හා 756 | (11) මු.රෙ 507 හා 756 |
| සමාලෝචිත වර්ෂය අවසානයේ දී රු. 17,642680.00 ක් වූ පුස්තකාල පොත් සම්බන්ධ සමීක්ෂණයක් ආරම්භයේ සිට මේ දක්වා ම සිදු කර නොතිබුණි. | ආයතනයේ පුස්තකාලයේ පොත් පිළිබද සමීක්ෂණයක් මේ වනවිටත් ඉටුකරමින් පවතී. |
| (ආ) 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364 (3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (ආ) 2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364 /(3) දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛණය |
| රු. 25,000.00 ඉක්මවා ගෙවන ලද එකතුව කළ අගය මත බදු පිළිබද මාසික වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව දේශිය ආදායම් කොමසාරිස් වෙත යවා නොතිබුණි. | 2012 වර්ෂයේ දී රු. 25,000.00 ඉක්මවා ගෙවන ලද එකතු කළ අගය මත බදු පිළිබද මාස 06 ක විස්තර විගණකාධිපති පිටපතක් සහිතව දේශිය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත විස්තර ලබා දීමට කටයුතු කර ඇත. |
| (ඇ) 1997 ජනවාරි 15 දිනැති අංක 8/97දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා 2002 ඔක්තෝම්බර් 16 දිනැති 09/2002 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | (ඇ) 1997 ජනවාරි 15 දිනැති අංක 8/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව අතිකාල දීමනා ගෙවීම් මසකට 20 කට සීමා කල යුතු වුවද ආයතනයේ රාජකාරි බිදවැටීමකින් තොරව පවත්වා ගෙන යාම සදහා පහත සදහන් හේතු මත ආයතනය සතු සීමිත කාර්යය මණ්ඩලයට අතිකාල ගෙවීමේ පදනම මත සේවයේ යෙදවීමට සිදු වන ලදී. මෙම අතිකාල ගෙවීම් සිදුකර ඇත්තේ විශ්වවිද්‍යාල කොමිෂන් සභා ලිපි අංක 09/2002 (2002 ඔක්තෝබර් 16) ට අනුව බව අනුකූලව බව සදහන් කරමි. |
| ඒ ඒ නිලධාරියා විසින් ඉටුකළ යුතු කාර්යයන් පිළිබද ඇගයීමකින් තොරව 70 ක්වූ අනධ්‍යපන කාර්ය මණ්ඩලයේ 63 දෙනෙකු සදහාම සාමාන්‍ය රාජකාරි කටයුතු සදහා මසකට පැය 20 ඉක්මවා රු. 2,382,992 ක් වූ අතිකාල මුදලක් ගෙවා තිබූ අතර . 2009 හා 2010 ක්වූ අතිකාල වර්ෂයන්හි මේ ආකාරයට සිදුකල ගෙවීම් පිළිවෙලින් රු. 2,463,589 ක් හා රු. 2,711,343 ක් වී තිබුණි. | මේ වන විට අභ්‍යන්තර චක්‍රලේඛ ලිපි මගින් අංශ ප්‍රධානීන් දැනුවත් කර අතිකාල ගෙවීම පූර්ණ අධීක්ෂණය යටතේ සීමා කිරීමට කටයුතු කර ඇත. |

**2.2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් පර්යේෂණ කටයුතු සඳහා ලබා දී තිබූ නමුත් එම කාර්යයට නොයොදවා 2006 වර්ෂයේ සිට බැංකු ජංගම ගිණුමක නිශ්ක්‍රියව තබා තිබූ රු. 664,820 ක්වූ මුදල් ශේෂය, කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2011 ආයුර්වේද වෛද්‍ය ප්‍රදර්ශන ගිණුමට මාරු කර තිබුණි.

**3. මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විද්‍යායතනයේ කටයුතුවලින් සිදු වී ඇති මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.165,903,410 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.142,942,199 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු.40,055,816 ක් වූ රජයේ ප්‍රදානය හේතු කරගෙන එම ඌනතාවය රු. 25,847,594 ක් දක්වා අඩු වී තිබුණු අතර, ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබී තිබුණු රු. 104,100,000 ක් වූ රජයේ ප්‍රදානය හේතු කරගෙන එම ඌනතාවය රු. 38,842,199 ක් දක්වා අඩු වී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඌනතාවය රු. 12,994,605 ක් දක්වා අඩු වී තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රාග්ධන ප්‍රධාන ගිණුම් තැබමේ ප්‍රතිපත්තිය " අයභාර පදනම " ලෙස වෙන් කිරීම නිසා රු. 24,455,028 ක් වූ වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය කිරීම් නැවත මෙහෙයුම් ආදායමට ගැලපීම ඊට හේතු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 **කාර්යය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අධ්‍යාපන කටයුතුවල නිරත 647 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව ආයතනය දැරූ පුනරාවර්තන වියදම රු. 147,735,489 ක් වූයෙන් ඒකක ශිෂ්‍ය පිරිවැය රු. 228,339 ක් වී තිබුණි.

2.2.6 එම ගෙවීම සඳහා මෙම ආයතනයේ 367 වන කළමණාකරන මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇත. විශ්වවිද්‍යාලයේ පාලක සභාව අනුමැතිය මේ සඳහා අවශ්‍ය නොවන බවද දන්වන කැමැත්තෙමි. මේ සම්බන්ධයෙන් 2012.06.22 දින පවත්වන ලද පාර්ලිමේන්තු කාරක සභා රැස්වීමේදී එම කමිටුවේ සභාපති වෙත මා විසින් පැහැදිලි පිලිතුරක් ප්‍රකාශ කරන ලදී.

**3. මූල්‍ය ප්‍රතිඵලය**

2011/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඌනතාවය රු. 12,994,605.00 දක්වා අඩු වී ඇත.

4..1 **කාර්යය සාධනය**

(අ) සමාලෝචිත වර්ෂයේ ඒකක ශිෂ්‍ය පිරිවැය පහත සඳහන් කරනු කැමැත්තෙමි.

| | | | | |
|---|---|---|---|---|
| 2011.12.31 දිනට මුළු වියදම | =රු. 204,633,481.00 | | | |
| අඩු කලා | | | | |
| 1. පාරිතෝෂික වෙන් කිරීම් | | රු.30,258,274.00 | | |
| 2. ක්ෂය වෙන් කිරීම් | | රු.26,639,718.00 | = | (රු.56,897,992.00) |
| ශුද්ධ වියදම | = | රු. 147,735,689.00 | | |
| ඒකක ශිෂ්‍ය පිරිවැය | | රු. 147,735,689.00/647= | | |
| | = රු. | 228,339.00 | | |

වෙළපොළ භාණ්ඩ මිල ඉහළ යාම වැනි කරුණු අනුව මෙම තත්වය අපගේ පාලනයෙන් තොරව සිදු වී ඇති බව කාරුණිකව දන්වමි.

(ආ) ලියාපදිංචි වූ සිසුන් පාඨමාලාව සාර්ථකව අවසන් නොකර අධ්‍යාපන කටයුතු හැර යන තත්වයක්ද විභාග අසමත් වන තත්වයක්ද පසුගිය වර්ෂ කිපය තුළම වර්ධනය වෙමින් පැවති අතර. ඒ පිළිබද කළමණාකරනයේ අවධානය යොමුවී නොතිබුණි.

| ඇතුළත් වූ අධ්‍යයන වර්ෂය | ඇතුළත් වූ සංඛ්‍යාව | 5 වන වසර රැදී සිට සංඛ්‍යාව | 5 වන වසර සමත් වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| 2004/2005 | 107 | 81 | 41 |
| 2003/2004 | 102 | 67 | 45 |
| 2003/2004(A) | 78 | 62 | 50 |
| 2002/2003 | 95 | 86 | 63 |
| 2001/2002 | 101 | 80 | 58 |
| 2000/2001 | 98 | 54 | 43 |

(ආ) මේ සම්බන්ධයෙන් දේශීය වෛද්‍ය ආයතනයේ හිටපු අධ්‍යක්ෂකගේ අංක IIM/D/172 හා 2011 05 13 දිනැති ලිපියෙන් පිළිතුරු සපයා ඇත.

4.2 කළමණාකරණ ආකාර්යක්ෂමතා

(අ) පිරිමි නේවාසිකාගාරය නඩත්තු කිරීම

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(I) වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 1995 ජනවාරි 11 දින ආයතනය වෙත භාර දෙනු ලැබූ කාමර 28 ක් සහිත ගොඩනැගිල්ලක පවත්වාගෙනු එනු ලබන පිරිමි නේවාසිකාගාරය, නේවාසිකාගාරයකට සුදුසු පරිදි වැඩි දියුණු කර නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි.

(අ) (I) 1995 වර්ෂයේ මෙම ගොඩනැගිල්ල බදු ගිවිසුමක් මත මෙම ආයතනයට පවරා දීමෙන් අනතුරුව අදාල අමාත්‍යවරුන්ගේ මැදිහත් වීමෙන් දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයට එම ගොඩනැගිල්ල පවරා ගැනීම සදහා සාකච්ඡා කරන ලද අතර එය මේ වන තෙක් සාර්ථකව ඉටුකරගැනීමට නොහැකි වී ඇත. දැනට තිබෙන ගොඩනැගිල්ල වාරිමාර්ග දෙපාර්තුමේන්තුව මගින් ඉදිකර ඇති නිසා මෙහි සම්පූර්ණ වෙනස්කම් කිරීමට ආයතනයට අයිතියක් හා හිමිකමක් නොමැත. එහෙත් හැකිතාක් දුරට වාතාශ්‍රය හා ආලෝකය ලැබෙන පරිදි එම ගොඩනැගිල්ල අළුත්වැඩියා කටයුතු කර ඇත. මෙම ගුමියේ නව නේවාසිකාගාරයන් ඉදිකිරීමට අවශ්‍ය අනුමැතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කර ඇත.

(II) ආයතනය විසින් වාර්ෂිකව සිසුන් ලියාපදිංචි කර නේවාසිකාගාරයට එවීම වෙනුවට සිසුන් නේවාසික වීමෙන් පසුව ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි.

(II) දැනටමත් නේවාසිකාගාර පහසුකම් ලැබීමට සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් 94 දෙනෙකු තෝරාගෙන ඔවුන් නේවාසිකාගාරයට ලියාපදිංචි කිරීම කාර්යාලය මගින් ඉටු කරනු ඇත. ඊට අමතරව ආයුර්වේද රෝහල් පුහුණුව ලබන අවසන් වසර සිසුන් මෙම නේවාසිකාගාරයෙන් නේවාසිකාගාර පහසුකම් ලබන බව දන්වනු කැමැත්තමි.

| | |
|---|---|
| (ආ) ස්ථාවර වත්කම් ලේඛන ගත කිරීම<br><br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>(I) ස්ථාවර වත්කම් සමීක්ෂණයෙන් අනතුරුව ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කර තිබූ නමුත් එය 1978 දෙසැම්බර් 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 842 හි ඇතුළත් පොදු ආකෘතිපත්‍ර 287ට අනුකූල නොවිය. | (ආ) (I) ආයතන සතුව පවතින ස්ථාවර වත්කම් ලේඛණයේ පහත සඳහන් විෂයන් යටතේ සකස් කර ඇත.<br>1. සංකේත අංකය<br>2. මෛතම විස්තරය<br>3. මිලදී ගත් වර්ෂය<br>4. වටිනාකම<br>5 තක්සේරු වටිනාකම<br>2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී එම ස්ථාවර වත්කම් ලේඛණයට අලුත් විෂයක් ලෙස ක්ෂය කිරීම් ඇතුලත් කර ඇත. ඒ අනුව ආයතනයේ වත්කම් වල වටිනාකම හා ක්ෂය ප්‍රමාණයන් හඳුනා ගැනීම හා වත්කම් වර්ග හා පන්ති හඳුනා ගැනීමට හැකි පරිදි සකස් කර ඇත. |
| (II) එම සමීක්ෂණයේදී පාවිච්චි කළ නොහැකි. වත්කම් ලෙස හඳුනා ගන්නා ලද රු. 1,193,625 ක අගයකට තක්සේරු කරන ලද වත්කම් ඒකක 172 ක්. අපහරණ කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | (II) ඔබ විසින් සඳහන් කර ඇති පාවිච්චි කල නොහැකි වත්කම් ලෙස හඳුනා ගන්නා ලද රු. 1,193,625.00 අගයට තක්සේරු කරන ලද වත්කම් ඒකක 172 ක මේ වන විටත් අපහරණය කර ඇත. |
| (III) චක්‍රලේඛ උපදෙස් පරිදි පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ලේඛනයක්ද, වර්ගීකරණ ලෙජර් ගිණුම් ද නඩත්තු කර නොතිබුණි. | (III) පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ලේඛණයක් ද වර්ගීකරණයක් සහිත ලෙජර් ගිණුමක්ද වැය පාලන ගිණුමක් ද මේ වන විටත් ආරම්භ කර ඇත. |
| 4..3 අරමුදල් ඌන උපයෝජනය<br><br>ආයතනයේ සාමාන්‍ය මාසික ගෙවීම රු. 2,175,000 ක් වූ බැංකු ජංගම ගිණුම් දෙකක රු. 6,765,000 ක සාමාන්‍ය මාසික මුදලක් පැවති අතර අතිරික්ත මුදල් ආයතනයේ මූල්‍යමය අවශ්‍යතාවයන් සඳහා ඵලදායී ලෙස යෙදවීමට කළමණාකරනය කටයුතු කර නොතිබුණි. | 4..3 1978 අංක 16 දරණ පනතේ උපදෙස් පරිදි රාජ්‍ය ප්‍රදාන ආයෝජනය කිරීමට අවකාශ නොමැත. කෙසේ වෙතත් විගණන උපදෙස් පරිදි මෙම කාරණය ඉටු කිරීමට දැනටමත් අවශ්‍ය කටයුතු සලසා ඇත. |

| 4.4 ආර්ථික නොවූ ගනුදෙනු | 4.4 |
|---|---|
| පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>(අ) තෙකලා විදුලිය ලබා ගැනීම සදහා වයර් මීටර් 76 ක් අවශ්‍යතාවයට වැඩියෙන් මිලදී ගැනීම නිසා ගෙවූ රු. 282,492 ක් නිෂ්කාර්යය වියදමක් වී තිබුණි. | (අ) ආයතනයේ අවශ්‍යතා සදහා ආර්මඩ් වයර් මටර් 250 ක් මිලදී ගන්නා ලද අතර ඉන් කොටසක් පරිපාලන ගොඩනැගිල්ලේ තෙකලා විදුලිය සැපයීමට යොදා ගන්නා ලදී. ඉතුරු කොටස ආයතනයේ අධ්‍යක්ෂගේ උපදෙස් පරිදි ද්‍රව්‍ය ගුණ අංශයේ ෆාමසියට යන්ත්‍ර සවිකිරීමේදී තෙකලා විදුලිය සැපයීම සිදු කල යුතු බැවින් එම කාර්ය සදහා උපයෝගී කර ගැනීමට තබා ගන්නා ලදී. |
| (ආ) අවම මිල ප්‍රතික්ෂේප කිරීමට හේතු නොදක්වා එම වර්ගයෙන්ම ජායා පිටපත් කඩදාසි පැකට් 350 ක් මිලදී ගැනීම නිසා රු. 17,500 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි. | (ආ) මෙම මිලදී ගැනීම් සදහා ආයතන 6 කින් මිල ගණන් ලබාගන්නා ලදී. ආයතනයේ අවශ්‍යතාවය මත ඇවලෝන් වර්ගයේ ජායා පිටපත් මිලදී ගැනීම සදහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය ඉදිරිපත් කරන ලදී. එහිදී ඇවලෝන් වර්ගය සදහා පහත සදහන් ආයතන මගින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි.<br>1. A.P. Enterprises - Rs. 437.50<br>2. Spinney trading - Rs. 440.00<br>2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5 - 3 - 18 (B) මගින් ලබාදී ඇති උපදෙස් අනුව තාක්ෂණික ඇගයීම් කිරීමේදී VAT බදු සැලකිල්ලට ගෙන නැත. ඒ අනුව ඇවලෝන් වර්ගයේ ජායා පිටපත් සදහා අඩුම මිල ගණන් ඉදිරිපත් කර තිබූ A.P. Enterprises ආයතනය මගින් එම මිලදී ගැනීම් සිදු කර ඇත. ප්‍රසම්පාදන උපදෙස් මාලාවේ එම කොටස් අමුණා ඇත. |
| (ඇ) මිල ගණන් ලබා නොගෙන රු. 578,048.00 ක් ගෙවා භාණ්ඩ වර්ග 06 ක් මිලදී ගැනීම හා එහි ඇතුළත් රු.166,500.00 ක් මිල වූ යකඩ ඇඳන් 10 ක් පරිහරණයට අපහසු බවට වාර්තා ව තිබුණි. | (ඇ) 2011 වසරේ නවක සිසුන් ඇතුලත් කිරීමේදී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් වැඩිපුර සිසුන් සංඛ්‍යාවක් එවීම නිසා ඔවුන්ගේ සුභසාධනය හා නවාතැන් පහසුකම් සැපයීම අවශ්‍ය විය. රාජ්‍ය මුදල් දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරල්ගේ පීඑෆ්/පීඑම්ඩී/3/4 හා 2011.01.26 දින ලිපිය අනුව ලබා දී තිබූ ප්‍රසම්පාදන උපදෙස් අනුව එම භාණ්ඩ මිලදී ගන්නා ලදී.<br>මේ පිළිබඳව එවකට සිටි අධ්‍යක්ෂවරයාගේ අංක IIM/FS/6/Girls hostel/2011 හා 2011.10.14 දිනැති ලිපිය මගින් විගණකාධිපති දැනුවත් කිරීමට කටයුතු කර ඇත. (ඇමුණුම් අංක 01) මෙම භාණ්ඩ දැනට ප්‍රයෝජනයට ගෙන ඇත.<br><br>4.5 එවකට නියෝජ්‍ය මූලාධිකාරිව සිටි කුමාරසිංහ මහතා ආයතනයේ ආරක්ෂක බිල්පත් |

## 4.5 හඳුනා ගන්නා ලද පාඩු

හිටපු මුල්‍යාධිකාරී විසින් පාලක සභාවේ අනුමැතියකින් තොරව ආරක්ෂක සේවා ආයතනය නමට ලියන ලද ගෙවීම් වවුචරයෙන් අඩු කොට මුදල් රෙගුලාසිවලට පටහැනිව අධ්‍යක්ෂවරයා වෙත රු. 282,060 ක් ගෙවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු නොකර රට දඬුවමක් ලෙස විශ්‍රාම යාමට ආසන්නව සිටි මුල්‍යාධිකාරීට හිමි වැටුපෙන් හෝ සේවක අර්ථ සාධක අරමුදලෙන් අඩු කිරීමට තීරණය කිරීමට වෙනුවට 1992 අංක 62 දරන පාරිතෝෂික ගෙවීම් පනතට අනුකූල නොවන පරිදි පාරිතෝෂික මුදල් අඩු කිරීමට 2010 අගෝස්තු 11 දින කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය හේතුවෙන් මුල්‍යාධිකාරී වෙත රු. 122,762 ක් වූ අධිකාර මුදලක් ගෙවීමට සිදු වී තිබුණි.

## 4.6 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව එක් සැපයුම්කරුවෙකුගෙන්ම වරින්වර මිල ගණන් 03 බැගින් ලබා ගෙන අවස්ථා 06 කදී රු. 413,985 ක් ගෙවා රතුපස්, ගල් හා වැලි කියුබ් 133 ක් ද්‍රව්‍ය ලැබීම් පිළිබඳ අධීක්ෂණයකින් තොරව මිලදී ගෙන තිබුණු අතර එයින් අවස්ථා දෙකකදී තෝරාගත් වෙනස් මිල ගණන් දෙකක් සඳහා වවුචරයේ මුදල් ලබා ගත් බවට වූ අත්සන එකම සැපයුම්කරුවෙකුගේ බවට නිරීක්ෂණය වීම හා අනෙකුත් සෑම අවස්ථාවන්හිදීම සැපයුම්කරු එම පුද්ගලයාම වී තිබුණි.

ගෙවීමේදී සොයා බැලීමකින් තොරව අධ්‍යක්ෂ කාර්යාලයේ තිබූ අධ්‍යක්ෂවරයාගේ පෞද්ගලික භාණ්ඩ නැතිවීම සම්බන්ධයෙන් එම බිල්පතේ කොටසක් එවකට අධ්‍යක්ෂ සිටි වෛද්‍ය සායක්කාර මහතාගේ නමට ලියෑවීම නිසා කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක බල මණ්ඩලයේ තීරණයක් මත කුමාරසිංහ මහතාගේ පාරිතෝෂික දීමනා ගෙවීම ප්‍රමාද වී ඇත. නමුත් විශ්‍රාම පාරිතෝෂික පනතේ උපදෙස් පරිදි ප්‍රමාද ගාස්තු ගෙවීමට කටයුතු කර ඇත.

4.6 මෙම ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් හැකි ඉක්මණින් ජලය පිරෙන ස්ථාන පස් පුරවා ගොඩකර ඩෙංගු මර්ධන ව්‍යාපාරයට සහයෝගය දක්වන ලෙස ඉල්ලා සිටීම නිසා මෙම ප්‍රදේශයේ පස් සැපයුම්කරුවන් වෙතින් මිල ගණන් 03 ක් ලබා ගෙන වැඩ අධිකාරීගේ නිර්දේශය හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය අනුව අඩුම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ප්‍රියන්ත සප්ලයර්ස් මගින් පස් ඇණවුම් කරන ලදී.ගෙවීම් කිරීමේදිද වැඩ අධිකාරීගේ නිර්දේශය ලබා ගෙන ගෙවීම් කර ඇත.

දේශීය වෛද්‍ය ආයතනය පිහිටා ඇත්තේ සංවර්ධනය කරන ලද වගුරු බිමක බැවින් නිතර දිය සීරාව පවතින ස්ථාන මෙම භූමියේ දක්නට ඇත. එම ස්ථාන පස්දමා පිරවීම හා ආයතනයේ පිවිසුම් මාර්ගය ඉදිකිරීමේදී රට අවශ්‍ය ගල් හා වැලි සපයාගැනීමට අවශ්‍ය වී තිබුණි.

හැකිතාක් දුරට නඩත්තු අංශයට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගනු ලබන්නේ රාජ්‍ය සමාගමක් වන ඉඩම් හා ඉඩම් සංවර්ධන සමාගම මගින් බව දන්වනු කැමැත්තෙමි. නාරාහේන්පිට කිරිමණ්ඩල මාවතේ පිහිටි එම ආයතනයට නිළධාරියකු යවා පස්, ගඟේ වැලි හා ගල් මිලදී ගැනීමට මිල කැඳවීම් ඉල්ලා යැවූ අතර එම ආයතනය මගින් එම ද්‍රව්‍ය දැනට සැපයීම් නොකරන බවත් එම ස්ථානයේ එම ආයතනයට සේවය සපයන ලොරි රථ හිමියන් මගින් එම ද්‍රව්‍ය ලබාගතහැකි බව එම කාර්යාලයේ සේවක මහතකුගෙන් දැනගැනීමට ලැබීම නිසා වැලි හා ගල් සැපයීම කරනු ලබන ලොරි රථ අයිතිකරුවන් කිහිප දෙනෙකුගෙන් මිල කැඳවීම් ලබාගන්නා ලදී. එම මිල ගණන් ආයතනයේ වැඩඅධිකාරී වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔහගේ නිර්දේශය අනුව ආයතනයේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය යටතේ අඩුම මිල ගණන් ඉදිරිපත් කර තිබූ සැපයුම්කරුවන් මගින් එම ද්‍රව්‍ය ලබාගන්නා ලදී.

| | |
|---|---|
| | ආයතනයට ද්‍රව්‍ය ලැබීම් පිළිබඳ පෙර වර්ෂයේ ද අධීක්ෂණයක් පවත්වා ඇත. නමුත් යම් යම් ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී ප්‍රායෝගිකව කටයුතු කිරීමේදී ඇති වන ගැටලු හේතුවෙන් සැපයුම්කරුවන් කිහිප දෙනකු පමණක් සිටින අවස්ථාවල එසේ මිලදී ගැනීමට සිදුවනු ඇත. |
| 4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු<br><br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>(අ) ප්‍රධාන ගිවිසුම් දොරටුව ඇතුළු කොන්ත්‍රාත් පහක් එක් ගිවිසුමක් යටතේ, සැලසුම් අනුමත කිරීමකින්ද නාගරික සංවර්ධන අධිකාරිය හා පහත් බිම් සංවර්ධන මණ්ඩලයේ අනුමැතියකින් තොරවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස්වලින් බැහැරව පත්කරන කොන්ත්‍රාත් උපදේශකගේ රු. 6.700.000 ක් වූ වියදම් ඇස්තමේන්තුවට වඩා 34% ක් අඩු වූ රු. 4.395.894 ක් වූ අවම මිලට තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිරීක්ෂණයට ලක් නොකර, කොන්ත්‍රාත්තුව පවරා තිබූ අතර එම කොන්ත්‍රාත් වටිනාකමෙන් රු. 3.315.740 ක් වූ වැඩ සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය පරිදි අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව කොන්ත්‍රාත් මිලෙන් 67% ක් වූ රු. 2.964.778 ක් වටිනා අතිරේක වැඩ කරවා ගැනීමෙන් අනතුරුව ආයතන ප්‍රධානියාගේ වාචික උපදෙස් මත කොන්ත්‍රාත්තුව අත්හිටවා තිබුණි.<br><br>(ආ) අත්හිටවූ කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩ ඉටු කර ගැනීම සඳහා ගෙවූ රු. 996.468 ක් ඇතුළුව කොන්ත්‍රාත්තුව අවසන් වන විට වැට් බදු හැර රු. 7.276.986 ක් ගෙවා තිබූ අතර එය රු. 4.395.894 ක් වූ කොන්ත්‍රාත් මිලට වඩා 65% ඉක්මවා තිබුණි. | 4.7 මතුභේදයට තුඩුදුන් අඩුපාඩු<br><br>(අ) හා (ආ)<br><br>එවකට සිටි අධ්‍යක්ෂවරයාගේ අංක IIM/D/172/2011 හා 2012-05-29 දිනැති මෙම ආයතනයේ 2011-12-31 අවසන් වූ වසරේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) ප්‍රකාර විගණකාධිපති වාර්තාවට පිළිතුරු සපයන ලද ලිපියේ පිටු අංක 12 ඡේද අංක 4.6 මගින් පිළිතුරු සපයා ඇත. |
| 4.8 කාර්ය මණ්ඩල පරිපාලන<br><br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>(අ) 2011 දෙසැම්බර් 31 දිනට 205 ක් වූ අනුමත මුළු කාර්යය මණ්ඩලයෙන් තනතුරු 42 ක් පුරප්පාඩු වී තිබුණි. | 4.8 කාර්ය මණ්ඩල පරිපාලන<br>(අ) හා (ආ)<br>එවකට සිටි අධ්‍යක්ෂවරයාගේ අංක IIM/D/172/2011 හා 2012-05-29 දිනැති මෙම ආයතනයේ 2011-12-31 අවසන් වූ වසරේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) ප්‍රකාර විගණකාධිපති වාර්තාවට පිළිතුරු සපයන ලද ලිපියේ පිටු අංක 13 ඡේද අංක 4.7 මගින් පිළිතුරු සපයා ඇත. |

| | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව 2011 දෙසැම්බර් 31 දිනට | පුරප්පාඩු සංඛ්‍යාව 2011 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|
| අධ්‍යයන හා සහාය කාර්ය මණ්ඩලය | 101 | 79 | 22 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 104 | 84 | 20 |
| | 205 | 163 | 42 |

(ආ) 1997 නොවැම්බර් 21 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 අනුව II ශ්‍රේණියේ තාවකාලික කථිකාචාර්යවරයෙකු එම තනතුරෙහි ස්ථිර කිරීම සඳහා තම ක්ෂේත්‍රයට අදාල වන පශ්චාත් උපාධියක් හැදෑරිය යුතු වුවද, වෙනත් ක්ෂේත්‍රයකට අදාළ වූ "තුලනාත්මක නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය " හැදෑරූ කථිකාචාර්යවරයෙකු II ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරෙහි ස්ථිර කර තිබුණි.

4.9 **වාහන උපයෝජනය**

ආයතනයේ වාහන 04ක් සඳහා ධාවන සටහන් හා ලොග් පොත් ක්‍රමානුකූලව නඩත්තු කර නොතිබූ අතර, නියමිත කාලයක් තුළ වාහන ඉන්ධන පරීක්ෂාවන්ද සිදු කර නොතිබුණි.

5. **ගිණුම්කරණ කටයුතු භාවය සහ යහ පාලනය**

5.1 **සංයුක්ත සැලැස්ම**

සංයුක්ත සැලැස්ම, අයවැය ලේඛනය හා කාර්යසාධන කාලීනව සමලෝචනය කිරීමද සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීමද සිදු කර නොතිබූ අතර, කාර්ය සාධන වාර්තා සකස් කර නොතිබුණි.

5.2 **ක්‍රියාකාරී සැලැස්ම**

අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීම සඳහා පැහැදිලිව වගකීම් පැවරෙන පරිදි නිලධාරීන් ඇතුළත්ව හා ඇස්තමේන්තු ගත වටිනාකම් සහිත ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණි.

4.9 **වාහන උපයෝජනය**

එවකට සිටි අධ්‍යක්ෂවරයාගේ අංක IIM/D/172/2011 හා 2012-05-29 දිනැති මෙම ආයතනයේ 2011-12-30 අවසන් වූ වසරේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) ප්‍රකාර විගණකාධිපති වාර්තාවට පිළිතුරු සපයන ලද ලිපියේ පිටු අංක 14 ඡේද අංක 4.8 මගින් පිළිතුරු සපයා ඇත.

5.1 **සංයුක්ත සැලැස්ම**

අයවැය ලේඛනය, කාර්ය සාධනය කාලීනව සමාලෝචනය කිරීමද සංයුක්ත සැලැස්ම යාවත් කාලීන කිරීමද දැනටමත් සිදු කර ඇති අතර කාර්ය සාධන වාර්තා ද සකස් කර ඇත.

5.2 **ක්‍රියාකාරී සැලැස්ම**

අරමුණු හා ඉලක්ක ඉටු කර ගැනීම සඳහා පැහැදිලිව වගකීම් පැවරෙන පරිදි නිලධාරීන් ඇතුළත්ව හා ඇස්තමේන්තු වටිනාකම සහිත ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත.

| | |
|---|---|
| 5.3 අයවැය පාලනය<br><br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>(අ) ආයතනයේ අයවැය ලේඛන සකස් කිරීමේදී යහපාලනය පිලිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුගමනය කර නොතිබුණි.<br><br>(ආ) අයවැය වියදම් ශීර්ෂ 04ක අයවැය ගත හා තථ්‍ය ආදායම් අතර 14% සිට 69% දක්වා වූ විචලනයන් පැවතීමත් තත්‍ය ආදායම, අයවැයගත ආදායමට වඩා 46% කින් පහළ මට්ටමක පැවතීමත් හේතුවෙන් අයවැය ලේඛනය සඵල කළමණාකරන පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි. | 5.3 අයවැය පාලනය<br><br>(අ) ආයතනයේ අයවැය ලේඛනය සකස් කිරීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් හඳුන්වා දී ඇති ආකෘති යටතේ අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හා ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කර ඇත.<br><br>(ආ) අයවැය වියදම් ශීර්ෂ හා තථ්‍ය ආදායම් ශීර්ෂ වන වෙනස්කම් අපගේ පාලනයෙන් තොරව සිදු වීම නිසා මෙසේ වෙනස් වී ඇත. හැකිතාක් දුරට මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබෙන පිළිවෙලට ආයතනයේ අරමුණු ළඟා කර ගැනීමට උපරිම කටයුතු කර ඇත. |
| 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම.<br><br>2009 හා 2010 වර්ෂයන්හි වාර්ෂික වාර්තා සභාගත නොතිබුණි. | 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම.<br><br>2009/2010 වර්ෂයන්හි වාර්ෂික වාර්තා සභා ගත කර ඇත. |
| 6. පද්ධති හා පාලනයන්<br><br>විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.<br><br>(අ) ගිණුම්කරණය<br><br>(ආ) කාර්යය සාධනය<br><br>(ඇ) ස්ථාවර වත්කම් පාලනය<br><br>(ඈ) ප්‍රසම්පාදන කටයුතු<br><br>(ඉ) මුල්‍ය පාලනය<br><br>(ඊ) ගබඩා පාලනය<br><br>(C) අත්තිකාරම් | 6. පද්ධති හා පාලනයන්<br><br>(අ) ගිණුම්කරණය<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මගින් 2006 වසරේ නිකුත් කර ඇති ගිණුම්කරණ ප්‍රමිති අංක 03 යටතේ 2011 වසරේ මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.<br><br>(ආ) කාර්යය සාධනය<br>දැනටමත් කාර්යය සාදන පිළිබඳ අවධානය යොමු කර ඇත.<br><br>(ඇ) ස්ථාවර වත්කම් පාලනය<br>2011 වර්ෂයේ රජයේ තක්සේරුවරයෙකුගේ සහය මත ආයතනයේ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ලේඛනයක් පිළියෙල කර ඇත.<br><br>(ඈ) ප්‍රසම්පාදන කටයුතු<br><br>2006 වසරේ නිකුත් කර ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් පරිදි සියලුම ප්‍රසම්පාදන කටයුතු මේ වනවිටත් ඉටු කර ඇත. |

| | |
|---|---|
| (ඌ) සේවක ණය<br><br>(එ) සැලසුම් සකස් කිරීම | (ඉ) මූල්‍ය පාලනය<br>මෙම ආයතනයේ කළමණාකරණ මණ්ඩලයේ උපදෙස් පරිදි මූල්‍ය පාලනය පවත්වාගෙන යාමට කටයුතු කරඇත.<br><br>(ඊ) ගබඩා පාලනය<br>කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශයේ සහයෝගය සහිත ගබඩාවේ කටයුතු කළමණාකරණය කර ඇත.<br><br>(උ) අත්තිකාරම්<br><br>මෙම ආයතනය අධ්‍යාපන ආයතනයක් බැවින් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් කටයුතු කිරීමේදී හා යහපාලනය සලකා ඒ ඒ අවශ්‍යතා සඳහා අත්තිකාරම් ගෙවීම සිදු කරනු ඇත.<br><br>(ඌ) සේවක ණය<br><br>ණය ලේඛන මනාව පවත්වාගෙන යාමට කටයුතු කර ඇත<br><br>(එ) සැලසුම් සකස් කිරීම<br>ආයතනය සම්බන්ධයෙන් සියලුම සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය ඉටු කිරීමට කටයුතු කර ඇත. |

සුනිමල් සේනාරත්න.
අධ්‍යක්ෂ,
දේශීය වෛද්‍ය විද්‍යායතනය,
රාජගිරිය.